ISBN 978-1-78280-808-4

යක්ෂ ගෝත්‍රිකයන්ගේ අප්‍රකට තොරතුරු

කතෘ -
ශාස්ත්‍රපති පණ්ඩිත් මානාවේ විමල රතනහිමි

ISBN 978-1-78280-808-4
9 781782 808084
ශ්‍රී රාවණ වංශය ග්‍රන්ථ කේන්ද්‍රය

පටුන

01 රවිශෛල්‍යාශ පරපුර සහ විෂකුම්භණ සූත්‍රය

02 යක්ෂ ගෝත්‍රික සිරිත් විරිත්

03 යක්ෂ ගෝත්‍රික නීති ක්‍රමය

04 යක්ෂ ගෝත්‍රික රවිශෛලාශ භාෂාවේ සන්ත්‍රාඥ අක්ෂර ක්‍රමය

05 රවිශෛල්‍ය යක්ෂ ගෝත්‍රික පද සාහිත්‍යය

ISBN 978-1-78280-808-4

හැඳින්වීම

යක්ෂ ගෝත්‍රිකයන්ගේ තොරතුරු යන මැයෙන් සම්පාදනය කරන ලද මේ කෘතියට මූලාශ්‍රකර ගන්නේ මංගම පරපුර වූ මාතලේ ඉරුගල් බණ්ඩාර (රාජකරුණා) වංශික වරිගපූර්ණිකාව නම් වූ පුස්කොළ ග්‍රන්ථයයි. කන්ද උඩරට රාජධානියේ රජ සමයේ මාතලේ පිරිවෙන් පරිවාර අරණවැසි බෝධි වංශ නම් හිමි නමක් විසින් මෙය රචනා කර ඇත. මෙයින් යත වර්ෂ ගණනාවකට එහා රාවණා යුගයේ සිට පරපුරේ සුරක්ෂිතව පැවති ග්‍රන්ථ රැසක් එකතු කරගෙන වරිගපූර්ණිකාව සම්පාදනය කර ඇත. කවිලාශපාලිසෑදිය, ඉරුගල්තෙදය, මුහුන්දෙයුර, සිවඅනුකන්ද, රතුගැරය, සිළුම්යාපත, විකුම්හණසෑදිය, වීරිංකොළුග ආදී ග්‍රන්ථ රාශියක් මේ වරිගපූර්ණිකාවේ ඇතුලත්ය.

රාවණ වංශ පුස්තක
සංරක්ෂණාගාරය
සතුය

පැරණි කෘතිවල එන ඇතැම් පැරණි පාඨ එලෙසම වරිගපූර්ණිකාවට ඇතුළත් කර ගැනීම නිසා භාෂා විමර්ශණයක යෙදෙන අයට මෙය ඉතාමත් වැදගත් කෘතියකි. රාජකරුණා (ඉරුගල් බණ්ඩාර) පෙළපතෙන් එන දෙමටවිල්ලි කොනොන ආර්. එම්. පී. බී. ඩිංගිරි අම්මා නම් වු උපාසිකාවගෙ නිවසේ තිබු වරිගපූර්ණිකාව පුස්කොළ ග්‍රන්ථය එතුමියගෙ අභාවයත් සමඟම අස්ථාන ගත වී ඇත. පරපුරු දැනසිටින් පමණ කතාවෙන මේ ග්‍රන්ථයෙහි අන්තර්ගත තොරතුරු දීර්ඝ ඉතිහාසයකට සාක්ෂි සපයයි. රාවණා රජුගෙන් පැවතගෙන එන ඉරුගල් බණ්ඩාර වංශය (රවි ගෙලාශ) ප්‍රබල යක්ෂ ගෝත්‍රිකයන්ගෙන්, නායකයන්ගෙන් පිරුන එකකි. රාවණා සමයේ සිට කන්ද උඩරට රාජධානිය දක්වා මේ වංශයට අයත් ප්‍රබලයින්ගේ නාම ලේඛනයක් වරිගපූර්ණිකාවෙන සොයා ගත හැකිය. රවිගෙලාශ වංශයේ මූලස්ථානය ලෙස සැලකෙන්නේ මිලෙසිරිනයි. අනෙකුත් ප්‍රාදේශීය ස්ථාන ලෙස සැලකෙන, ගිරි දිවයින, ලොව දේශය, විජුකසංදේශය, උඩුලවනගිරි දේශය, සබරගිරි දේශය, සන්තාන ගිරිය, රතුන් ගිරිය, (රිටිගල) යන ස්ථානවලද රවිගෙලාශ වංශයට නෑ සබඳකම් පවත්වන යක්ෂ ගෝත්‍රිකයෝ විසූහ. මේ ප්‍රාදේශීය රාජ්‍යයන්ට මූලස්ථානය වූයේ මහාගිරයි. මහාගිර හෙවත් ශ්‍රී පාද කන්ද ආශ්‍රිත කරගෙන යක්ෂ ගෝත්‍රිකයන්ගේ ප්‍රධාන රාජධානිය පිහිටියේය. උතුරු ප්‍රදේශය පාලනය කළේද යක්ෂගෝත්‍රිකයන් විසිනි. එම පරපුර *කොවිකස්ථ රජම* නමින් හැඳින්වූ වරිගපූර්ණිකාවේ "*කොවිකස්ථ රජම ලදියම්*" ලෙස හඳුන්වා ඇත්තේ යාපනය ප්‍රධාන කරගත් උතුරු ප්‍රදේශයයි.

රාවණා රජුගේ පුතුන් දෙදෙනකු වූ *රවිගෙලාශ* හා *කොවිකස්ථ* යන දෙදෙනාගෙන බිහිවූ පරපුර පාලන තවුරුතු සඳහා හිමිකම් ලැබූ බව වරිගපූර්ණිකාවේ සඳහන් වෙයි. ඒ අනුව කොවිකස්ථ වංශය රවිගෙලාශ වංශයෙම ප්‍රේමීන් බව ප්‍රකාශ කරන වරිගපූර්ණිකාවේ කතුවරයා *වනාශ රවිගෙලාශයන්* යන නමින්ද *කොවිකස්ථ* පරපුර හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ විසූ යක්ෂගෝත්‍රිකයන් කොටස් 03 කට බෙදා දක්වන වරිගපූර්ණිකා ග්‍රන්ථය එවා තුලයන ලෙස මෙසේ නම් කරයි.

I. *රවිගෙලාශ හා වනාශ රවිගෙලාශ යක්ෂයන්*

II. *කොවිකස්ථ යක්ෂයන්*

ISBN 978-1-78280-808-4

තොරතුරු මේ කෘතිය සම්පාදනය කර ගැනීමට යොදා ගෙන ඇත. වරිගපූර්ණිකාව ශුද්ධ කිරීමෙහි මහත් වෙහෙසක් ගත් දුම්බර ශ්‍රීපාලි රාජකරුණා මහතාට අත්කරගත වූ වරිග පූර්ණිකා ග්‍රන්ථය ඊට පෙර මුළුමනින්ම කියවා ඇත. යක්ෂ ගෝත්‍රිකයින්ගේ පරිපාලනයට යටත්වූ ප්‍රදේශ පිළිබඳ එහි සඳහනේ ඇතැම් නාමයන්ගේ සිංහල පෙරැළුම ලබා ගැනීමේ දුෂ්කර භාවය හේතු කර ගෙන එම ප්‍රදේශය පිළිබඳ නිවැරදි තොරතුරක් ලබා ගැනීමට දුෂ්කර වී ඇත. ප්‍රධානව මේ ග්‍රන්ථය රචනා වී ඇත්තේ නීලගිරි දේශය (මාතලේ) ගැන තොරතුරු කියා දීමට නිසා ඒ ගැන වඩාත් අවධානය යොමු කර ඇති බැවින් අන් ප්‍රදේශ ගැන සඳහන් වී ඇත්තේ නාමිකව පමණි. වරිගපූර්ණිකාවේ කවිලාශපාලි පත්‍රුරුවෙහි සඳහන්වන. ශ්‍රී මහෝත්තම විරාජමාන ශාක්‍යවංශාලංකෘතවූ සම්‍යක් සම්බෝධි ඊයන් බුදු තැන හා මිලා පී කලෑ මිහි මිහි දෙගේ උත්තර කොදෙව්වෙන් කෙවෙයස්ථ යන්නා රකුන් කුල නිද්සිනා ඊ කරා වලපෙති වී. කාගෝරා කන්දීරය ඊම වැ මහා ගිරි රකුන් පති අනාදාව කරා සෙලීව ඊව්ග මේනියාවෙන් පත්‍රුරු කරමින. වෙංගෙනි ක්මිර කෙමවැ මිනිමම් දෙස්.

.ඔදැරිය උපුල්වන් ගිරිදෙස් රකුන්පති ඊ වලපෙති වී
ඔදැරිය රකුන් ගිරි දෙස් රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය නීලගිරි දෙස් රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය කාවශ්ලාශ රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය දුමක කද්දීර දෙස් රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය වාලුක දෙස් රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය අග්නි දෙස් රකුන් පති ඊ වලපෙති වී
ඔදැරිය විලෝපාදී දෙස් රකුන් පති ඊ වලපෙති වී.

මෙයින් ජනපද 07 ක් රිටිගල යක්ෂ ජනපදයට (රකුන්ගිර) යටත්ව පැවතුන නිසා වරිග පූර්ණිකා කතුවරයා එය සත්තානා ගිර ලෙස හඳුන්වයි. රක්ඛ මිහිලා සන්දේශයේ දී ද රිටිගල කන්ද සඳහා එම නාමය යොදා ඇත. උක්ත නියමිත පරිදි ලංකාවේ උතුරු ප්‍රදේශයෙහි කේවසස්ථ නම් යක්ෂ ගෝත්‍රික කුලයට අයත් පාලන තන්ත්‍රයක් විය. මෙහි මහාගිර යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී පාද කඳු වැටිය විය හැකිය. එහි කේන්ද්‍ර කරගත් රාජ්‍ය තන්ත්‍රයක් දකුණු ප්‍රදේශයේද විය. දකුණ වශයෙන් මෙහි හඳුන්වන්නේ අනුරාධපුරයෙන් මෙහා කොටසයි. වරිග පූර්ණිකාවට අනුව මෙම අනිකුත් යක්ෂ ගෝත්‍රිකයන්ගේ පරිපාලන ප්‍රදේශ වූයේ (ප්‍රාදේශීය රාජ්‍ය) පිළිවෙලින්

1. උපුල්වන් ගිරි දේශය (දුම්බර ප්‍රදේශය)
2. රකුන් ගිරි දේශය (රිටිගල ප්‍රදේශය)
3. නීලගිරි දේශය (මාතලේ කඳුවැටි ප්‍රදේශය)
4. කාවශ්ලාශ යක්ෂ කුලයේ පාලන ප්‍රදේශය (ගවරගිරි දේශය)
5. ධූමක කද්දීර දේශය (කලාවැව ප්‍රදේශය)
6. වාලුකා දේශය (හම්බන්තොට අඩවිය)
7. ඉන්ද්‍ර දේශය (සමනළගිර)
8. අග්නි දේශය (ගිණිකොහන දේශය)
9. විලෝපාදී දේශය

යන ප්‍රදේශයි. මෙකී ප්‍රදේශ වල පාලන බලය ඉසුලුවේ ප්‍රාදේශීය යක්ෂ සෙන්පතියන් විසිනි. වරිග පූර්ණිකාවට අනුව ලංකාවේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ප්‍රධාන රාජ්‍ය දෙකක්

ISBN 978-1-78280-808-4

3. සුවානමූල : තර්කයෙන් ධාරනය කර ගැනීමේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා බේර වැල් නම් ඖෂධ විශේෂයක්ද උපයෝගී කරගෙන ඇත
4. ලලන්තමූල : කෙනෙකුගේ උද්වේගයන් ධාරණය කර ගැනීම උදෙසා සුගෝමින නම් ඖෂධ විශේෂයක්ද යොදා ගත් බව ප්‍රකාශ වේ
5. විධාරමූල : ස්වශක්තියෙන් පාඩම් අවබෝධ කර ගැනීම උදෙසා ඉක්ලිග නම් ඖෂධයක් භාවිතා කර ඇත

ගැඹුරු ධාරණ ශක්තීන් කරා සිත යොමුකිරීමේ ද කායික මානසික වශයෙන් ඇතිවන දුර්වලකම් හා උදාසීන ගතිය වලක්වා ගැනීමට මේ ඖෂධ විශේෂය භාවිතා කර ඇත. සමාපත්ති දක්වා සිත දියුණු කළ අයෙකුට අනුන්ගේ සිත් දැන ගැනීමට හෙවත් පරචිත්ත විජානනය පහළ වේ. එසේ හෙයින් අනුන්ගේ සිතේ රෝගී තත්වයන් තේරුම් ගැනීමේ හැකියාවක් මෙන්ම එයට ප්‍රතිකාර කිරීමේ හැකියාවක් ද ඔවුන්ට තිබුනි. යක්ෂ ගෝත්‍රිකයන් ප්‍රගුණ කලේ කවර භාවනා ක්‍රමයක් ද යන්න නිශ්චිතවම සඳහන් නොවේ. එයට එක් හේතුවක් වූයේ ඔවුන් හදාල දර්ශනයට වඩා ගැඹුරු දහමක් වන බුදු දහම හදාරන්නට ලැබීම නිසා එය යටපත් වී ඇති බැවිනි. ඔවුන් දේවත්වය පිළි නොගත් නිසා ලෝකයේ පැරනිම භෞතිකවාදීන් වුවාට සැක නැත. භෞතිකවාද දර්ශනය බිහි වීමෙහිලා මූලික පදනම වූයේ ශ්‍රී ලාංකීය යෝග දර්ශනයයි. බුදුරජාණන් වහන්සේද මේ දර්ශනය හොඳින් දැන සිටියාට සැකයක් නැත. සුමාලි රජු යෝග හා වෛද්‍ය ක්‍රමය ඉතාමත් ගැඹුරුන් හදාල කෙනෙකු වූ බැවින් ඔහු වටා විශාල පිරිසක් ඉගෙන ගත්තාය. ඒ අතර විදේශ සිසුවෝද වූහ. සුමාලි රජුගේ කීර්ති රාවය දඹදිව පුරාද පැතිර ගියේය. දඹදිවද එතුමාගේ යෝග ආශ්‍රම බිහිවිය

යාග හෝම වැනි හිංසක පූජා ක්‍රම මුල්කරගත් වෛදික දහමට ප්‍රතිවිරුද්ධව මේ දහම ඉන්දියාවේ ව්‍යාප්ත වූ බැවින් මෙහි අනුගාමිකයන්ට කායික පීඩන විඳීමට පවා සිදුවිය. රාමායනයේ හඳුන්වන පරිදි දඹදිව දණ්ඩක වනය නම් වූ තපෝ භූමියේ සිටි යෝගීන්වද රාම රජුගේ පිරිස විසින් හිංසා පීඩා කරන ලදී. එමෙන්ම නොව ලක්දිවට පැමිණි රාම රජුගේ පිරිස මෙහි යක්ෂ ගෝත්‍රිකයන්ටද හිංසා කලේය. වෛදික දහම සහ යෝගී දර්ශණය යන ඉගැන්වීම් එකිනෙකට ප්‍රතිවිරුද්ධ මතවාද දෙකක් මුල් කරගෙන ගොඩනැගී ඇති බැවින් එම ආගම් අදහන දෙපිරිසේ චර්යා ධර්ම වලද කැපී පෙනෙන වෙනසක් දැකිය හැකිය. දෙවියන් උදෙසා යාග හෝම පැවැත්වීමෙන් ආර්යයන් බලාපොරොත්තු වූයේ ලෞකික ජීවිතය සැපවත් කර ගැනීමයි. යුධ මානසිකත්වයද ඔවුන්ගේ චර්යා ධර්ම වල කැපී පෙනෙන ලක්ෂණයකි. යාග හෝම වල ස්වභාවය ගැන අධ්‍යයනය කිරීමෙන්ද එය වඩාත් තහවුරු කරගත හැකිය. යාගය පවත්වනු ලබන්නේ සෝම නම් දිව්‍ය පානය ගැනීමෙන් අනතුරුවය. මෙය මත් ද්‍රව්‍ය විශේෂයකි. ගින්නට දමන යාග ද්‍රව්‍යවල ශේෂය ඔවුන් ආහාරයට ගනී. යාග හෝම පවත්වන නොපවත්වන්නෝ භාග්‍ය වන්තයෝ නොවූ දෙව උදහසට ලක් වූවෝ වෙති. දෙවියන්ට විරුද්ධ වන්නා වූ අය අසුරයන් හෝද යක්ෂයන් හෝද සැලකීමට සුදුසුය යන්න ඔවුන්ගේ පිළිගැනීමයි. යුද්ධය යනු ආර්යයන්ට වාසනාව ගෙන එන්නකි. ඔවුන්ට වැසි ඵල පවා ලැබෙන්නේ දෙවියන් විසින් කරනු ලබන යුද්ධයේ ප්‍රතිඵලයක් හැටියටයි. සුරාසුර යුද්ධය, රාම රාවණා යුද්ධය වැනි යුද කතා වෛදික සාහිත්‍යට එකතු වී ඇත්තේ ආර්යයන් යුධ

ISBN 978-1-78280-808-4
9 781782 808084
ශ්‍රී රාවණ වංශය ග්‍රන්ථ කේන්ද්‍රය

මහින්ද යුගයට පෙරාතුව ඉන්දුව බුදු දහම පිහිටුවූ බවට මෙය හොඳ සාධකයකි. බුද්ධ ශ්‍රාවිකාවක් වූ කච්චායනගොත්‍ර රිජිනිය නම් දෙවි වර්ගයාට මෙසේවත් කරුණාව දැක්වූවාය. තිලභිර්ගේ දී බුදුරජාණන් වහන්සේ දෙසූවා දුන් ජිනකුම්භණ ගාථාව බුදුන්ගේ ගුණ උපමා කරගෙන ධර්මය දේශනා කළාය. රාජකරුණා වංශික වර්ග පූර්ණිකාවේ අය විසින් දේශනා කරන ලද ජිනකුම්භණ සූත්‍රයේ ඇතැම් අගනේදීම වචන වලින් පෙනී යන්නේ එවා යක්ෂ ගෝත්‍රික වචන වශයෙන් තිබී ප්‍රස්තාව ප්‍රසාරයට එරලතම ඇතුලත් කරගත ඇති බවයි. මෙය සිංහලට පරිවර්තනය කිරීමද තරමක් දුෂ්කර වූ බවද මෙහි සඳහන් කරමු. මෙම සූත්‍රය සිංහලයට පරිවර්තනය කර ගැනීම උදෙසා රාජකරුණා කිරිබණ්ඩා මහතා සහ රාජකරුණා සිංඤෝ අම්මා මාතාවද, ආර් ඩබ්ලිව් මුදියන්සේ රාජකරුණා යන අයගෙන් ලැබුණු සහාය ඉමහත්ය

ජිනකුම්භණ සූත්‍රය (වර්ගපූර්ණිකා අනුවාදය)

1. භාග්‍යවත් සම්බෝධි හිඳුකාණන්ගේ සවනක ඝන රශ්මි ධාරා දිවම් ජේත්‍රාලංකාරයක් වන්නේය. නුබය, මිහිය, මේඝය, වාතපලය සිතානද මතින් සම්බෝධි බීජය මඩල වකුවා දිලෙනා වී. රශ්මි ජේතුක ජිනකුම්භණ රැසිද පූජාය වී ඒ බව අඩයාලම කියන්නේ යොගයින් භව දොස නැසීමේ ජිනකුම්භණ රැස සමෙන සම්බෝධි මා පිහිටත්ම වී.

2. දිවම් ශාක්‍ය මුනීන්ද්‍ර ලලාටයේ ඌර්ණ රෝම ධා පිහුම් වළුව දාරණයෙහි, මා සුගති බට මිහිලා තොරණ වී. සර්ව ලෝකාධිපති සම්බෝධි විසන් ශ්‍රී බිඳු ඌර්ණ රෝම දාව භවදුක් ජේදනයේ මුලද්වාරයම් වන්නේ ජිනකුම්භණයේ කරවිද ඌර්ණ රෝම දාමයම වී. යොගයින් භව දොස නැසීමේ ජිනකුම්භණ රැස සමෙන සම්බෝධි මා පිහිටත්ම වී.

3. දිවම් විකසිත වූ සමනක සම්බෝධි වූ මුව කමල ඊ රශ්මි සිරව පාසු චන්ද මඩල වන්නා යේ. තිර නොවී මේ භවදුක් නසා ලූ අරූප ඇත්තේ ඊ වන දිවම් ශාක්‍ය මුනි මුව කමල ජිනකුම්භණ රැසේ එලයම් වන්නේ යොගයින් භව දොස නැසීමේ ජිනකුම්භණ රැස සමනක සම්බෝධි මා පිහිටත්ම වී.

4. දිවම් වීතරාගී වූ චීවරයෙන් සෝභිත සුගත් සිරිදෙහ පද්මය. සමිර පිළු රැදී දැමරත් කඳ මෙනි. භවයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සෙත දිවම් ජිනකුම්භණයේ කඳ ශාක්‍ය මුනි දෙහ පිහුම වී. යොගයින් භව දොස නැසීමේ ජිනකුම්භණ රැස සමනක සම්බෝධි මා පිහිටත්ම වී.

5. දිවම් අරූත් ඇත්තා වූ දුක් මා කල ශ්‍රී සම්බෝධි සෙත පද්මය. සසර මන සිහළුව දුකට ඇත්තේ වී මුත් සිවසත මන ඊ බඩය. සම්බෝධි උත්තම ශ්‍රී සෙතය ජිනකුම්භණය පට වන්නේ. යොගයින් භව දුක් නැසීමේ ජිනකුම්භණ රැස සමෙන සම්බෝධි මා පිහිටත්ම වී.

6. දිවම් මහා සිරි මංගලයක අඩයාලම ඇත්තා වූ ශාක්‍ය මුනි සිඳුද, පතුම් පත්ලෙහි මෙතතල පුරා වැඩසිද සිරිපාවන් අත්‍රී මෙන පරිසර පැසෙ මුනිසිරිපා සම්මුඛයේ ජිනකුම්භණයේ මුලද්වාරයම් වී. භව දුක් නැසීමේ දුන බිඳු ඇත්තා වූ සිරි දිවම් යොගයින් භව දුක් නැසීමේ ජිනකුම්භණ රැස සමෙන සම්බෝධි මා පිහිටත් වී.

7. දිවම් සතන වූ සිරි සෙතයේ සිහිනට සුදු බව, දුක්ඛ දුක්ඛ සමුදය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා මාර්ගය දුන දුක්ගෙන් සිහිනට සුත්තොම ඊ ශාක්‍ය මුනි සෙ

ISBN 978-1-78280-808-4

සත්‍යය විශ්වුම්භයාගේ යොග් පතලාවී ගොසයින් හට දුක් සැහීමට විශ්වුම්භයා රුග සම්භව සම්බන්ධ මා පියාණම වී.

8. දිවම් තිසාත විද්‍යාතා අරයාව ඵම ගාවා දුර්ශනලාවී සම්බන්ධ ඥාසායා හෙවාන්දකාර පසතු ඉද්රද ඉදුරන් දුමිනු ඉද්රද විශ්වුම්භයාගේ පතු යාසත ඉත සැහ වලවී. යොසයින් හට දුක් සැහීමට විශ්වුම්භයා රුග සම්භක් සම්බන්ධ මා පියාණම වී.

විශ්වුම්භයා සූත්‍රය 02 (පති පතිනි පත් ගුරු පාඨය)

පෙනුලොකාශ්‍ර සම්බන්ධ පිතෘන් දෙසුරයන් මහල්වග (ලොපතු) සිහිකවයුතු ඇත්තේ-බලාපි ශුන්තොවී විතරාගී නිර්වාණ විත්තයම සුඛය වී. හස්ත බන්ධනය ආර්ය සවිවන් නොවන්නවුන්ගේ එලෙබීයාව (පැමැණීම) වී. ගෙගෙහෙන් පුභාවල රතුඟ ගතාපව කියම්හ. කාමරාගය සත්පැයම වී.

.ඊ පීතල රාගයෝය.
රාමල් රාගයෝය.
දෙගුල් රාගයෝය.
බරත රාගයෝය.
ශුංඝු රාගයෝය.
ජලිත රාගයෝය.
ටිපි රාගයෝය.
සාදි රාගයෝය.
චකිත රාගයෝය.
කාංගි රාගයෝය..

පීතල රාගයෝ කිමිදැයි අසම්හ. උහුන් මහිලාවෝ පුරුෂයෝ කරාද නොපතාවී. මහිලාවෝ මහිලාවියක පතාලූය. පුරුෂයෝ පුරුෂයකු පතාලූය. උහුන් විපරීත කාම බන්ධනයේ වෙලෙත්.

රාමල් රාගය කිමිදැයි කියා පතලූවී.

උහුන් මහිලාවෝ පුරුෂයෝ කරාද පුරුෂයෝ මහිලාවෝ කරාද මහිලාවෝ මහිලාවෝ කරාද පුරුෂයෝ පුරුෂයෝ කරාද නොපතාලූ වී. කීන්දල පුෂ්පය ජම පාහී ගෙඩි තනනා සේ තමාගේ කාම සගයා තමාම වෙත්.
කැම වු මහිලාවුන්ගේ සිරුර පහස පතාලූ පුරුෂයෝද. කැම වු පුරුෂයෝ කාම සුඛය පතාලූ මහිලාවෝද දෙගුල් කාම උන්මාදයෝ වෙත්.
තඩිඩි මහිලා කාය පහස පතාලූ පුරුෂයෝද තඩිඩි පුරුෂ කාය පතාලූ මහිලාවෝ බරත කම ගන්දනයෝ වෙත්.

හෝරා නොදත්වී මැනියෝ පියාණෝ නැග. බෑද. මයිල. දුහිතෘ. පුතුන් පුතුනු නොපතනා කාම රාග විලෝකලාවෝ ශුංඝු කාම රාගයේ දැවවී.

ISBN 978-1-78280-808-4

මහිලාවක එක දුනිනා කාම රාගයෙන් මුසාවේ වූහ වහි කාම ගද්ධාගයේ ගෙන්

බඹුපුරයෙ ගාබුන්ට්‍රී ගෝතුය කරත්ද කාම මහානාවිර පෙවූවහ ඇද කාම ගද්ධාගයන් කැගතා කාම නාගය අර්හත් ගෙයි වැරි මුසාවේ වූහ මිනිගෙනි ගද්ධාගයන් දැවත්

සර්ව කාම ගද්ධාගයන් අත්තා වූහ කාම වැහි ගහ හින්ත් උගෙන් උගෙනම රතුෆ් ඊග ගෙනාවත්ද ගාභග මූසා නෙක්ඛම්ම පාරමි බැගයනි අගතක

සතානු කාම රාගයන් මිලෑරිය
නෙක්ඛම්මය පාරමි ඒ
නෙක්ඛම්ම උප පාරමි ඒ
නෙක්ඛම්ම පරමත්ථ පාරමි ඒ

රතුහිරි (රිටිගල) නීලගිරි (මහාකන්ද) බොගහල්පි පෙරුම් පෙරූ ධනක බලයෙන් කාම රාගයන් ගෙනකාගයත්.

මහිල රූප ශෝභාව අතීරය
කෙතාගෙවා කිසිරිග කළද (මලවර) රාවිය
රගත් හිජාවා රාවි
ජිහිරි කළද ගර්භ වැදුගෙවි කුසු නිපාවා රා ඒ
ගෝති විකාධි ඇති කලුද අළු කුසින් රා ඒ (කාමය රෝග)
ගෙගහයින් මහිලා මන්ථන ගෙගෙම් ඉවසීම දුක් අති පසාලුය.
කාම රාගය ගිනි ජලනී
කාම රාගය අශූචියකි
කාම රාගය බාලවූ මූලාව කුසු දැවි ගයෙ ඒ
පශ්චියම ඇත්තේ ඒ වාලු ඇත්තේ ඒ
අපායම ඇත්තේ ඒ නොපොව ඇත්තේ ඒ

ගෙගහයින් සුව නොලද්ද වීමය. අග්නි මේගයන නිවාලූයෙම කම්පොති ගදුධර්ම රත්නාකාරයෙහි කාමගිනි නිවා දුරුගත් කළ යුත්තා ඒ විතරාගි දැහැන්වර මුනාලු ච (සුදුසු) ඊ දැහැන්වර අංගයය ඒ.

බලවීර සුසීල දැහැන්ය.
මහා නිර්වාට දැහැන්ය.
බල ධීරත දැහැන්ය.
තින්ති චණ්ඩාක දැහැන්ය.
සර්ව සුඛ ලාභිලනය දැහැන්ය.

සුසීල දැහැන් ගෙල සිල්වත සර්ව පඤ්චේන්ද්‍රියගෙම් ගෙචතසිකයන් දැක වියාම් දැහැන් වඩත්.

නිර්වාට සුඛි සුද්ධයෝ පඤ්චේන්ද්‍රිය චෛතසිකය ද්වන්ද නොවැ වියරු බිදත්.

ISBN 978-1-78280-808-4
9 781782 808084
ශ්‍රී රාවණ වංශය ග්‍රන්ථ කේන්ද්‍රය

සිර දැහැන් වඩ සීලවත් කමක් පොලත් (කෙළවරක් නැති) නැත්තාවී කාමරාගයේ නොබැඳෙත්.

බල දැහැන් සුසීලයෝ වන්ඩ ගුගුල (මාරුතය) ආදී නොසැලෙන නියා රාගාභාවට නොබැඳෙත්.

වණ්ඨාන ගුහුන් භවතතු දැන කාම රාගයේ මුලා නොවෙත්. පාණ්ඩලන උවැසි තෙම සූර්ය රජ සක්වල ජෙති කලයේ කාමරාග බිඳිත්. භවත්තංදබර්ය මසිවු කලැ ඒ. නාමන තුදුන නොගෙවී දැයි තෙපලමින.

ශාක්‍ය මුනි ගෞතම අමෘත පීතෘ විමකුම්භණය වී
ශාක්‍ය මුනි සොතාපත්ති ඊ භව විමකුම්භණය වී
ශාක්‍ය මුනි සැදැ ගැමිය ඊ භව විමකුම්භණය වී
ශාක්‍ය මුනි අනාගැමිය ඊ භව විමකුම්භණය වී
ශාක්‍ය මුනි අරහත්ය ඊ භව විමකුම්භණය වී

ජන්මයේ පටන් විසද්කදානයෝ පලා බව යන්නේ තුරාව කාමරාගයේ නොබැඳෙත් වී මැ. සුවී ශුද්ධයෙන් ද්විතියානු දැහැන් විලුහු තෙමේ කයේහි නිර්වාට දැහැනිය වී. ඊ බව දැහැන් උපවසගු හිනි බුබුල පුම්පයේම සරි වී. ඊ බොවුවාව (පොහොට්වුව) දැකැපි. දග පත්තු (පියුම) මලිපය දැකැපි. සොබුල් වැ (පරවී) බංගවු පුම්පය දැකැපි. සොබුල් රූපන දීනිය තු මිටු වන්නා දැකැපි. (බිම වැටී ඇති පර මල) ඊ නියාවේ (එලෙස) භව ජන්පලිකාව (දෝෂය) දන්නාවී. හැදින්නා වී (දැන හැඳින) සර්ව විලෝපයේ (සියලු දුක්) දැකැපියේ ඊ අරුත් ගත. යෙහෙයින් මා ශාක්‍ය මුනි පීතෘන් ශ්‍රී සද් දහම් මිනි ගුගුල අගතය කම්රමෝ තුලු විමකුම්භණය වී. සොබුල් හංග වී (ගිලිහි විනාශ වී) සොබුල් පුපන (පර මල්) බහිය (රොඩු) හුම්වු වීම (දිරාපත් වීම) ජංජාලිය. මංඩාල අරුත්. යෙහෙන් හස්ත බන්දන කලපිමුත නාගරාජ මීත රක්ෂා කලාවී නියාවේ වීතරාගී සුසීලය රක් පති පතිනි දෙවිසියෝ ධිරත දැහැන් ගත වී ශුය.

සිවී පේදා වුහම් වර්යා ධනාන රකිතිය
කාමමිතතාචාරය නොකරන්නෝය
කමක් පොලක් නැතිවැ නොබැඳෙත්මය
දුතිපයෙන් (දැනුමෙන්) නෙක්ඛම්ම පිරම් පුරන්නාවෝය
උහුන් ධනාන වර පසක් කර ගේතු වන්තයෝම වී

යෙහෙයින් මා ශාක්‍ය මුණි ශ්‍රී සද්ධර්ම මිණි ගුගුල භවාන්ත අගාතය කම්රමෝතුලු විමකුම්භණය වී.

අදව නැසි කල මී තොරමෝ කරා ඔබසර රක්ෂා කලාවී. පතියෝ වන්ඨාන දැහැන් වඩන්නාව. මෝදු වී බඩ තලා පී අරවු ලබන්නා නියා වේ මීලු බීජු වේ වට සර්පකය මලිවු කරැ සහල් බඩතියාවේ කාමාෂ ගෙදෙල් කරැ කොබුලෙන් ගෙදෙල්ලෙ (රොඩු ඉවත් කොට) සිවු බල ලබත්ය. (චතුරාර්ය සත්‍යය) යෙහෙයින් මා ශාක්‍ය මුනි ශ්‍රී සද්ධර්ම මිනි ගුගුල බාවාන්ත අගාතය කම්රමෝතුලු විමකුම්භණය වී.

එකැම හිමියෙක් කරත කොට උහු කරා පතිව්‍රතා ශීලය රක්ෂා කලා වී මහිලා රත්තයෝ පාණ්ඩලන දැහැන් ධාරිති වී. මී දැහැන් සර්පයමැ වඩන්ති.(උතුවම මාලාහරණ ශීලය)

ISBN 978-1-78280-808-4

රත්නපාලි මහානාම රජුගේ බිසවයි.

ගස්සාකත හෙරළ (අංගම්පුර සටන්)

වැඳහු කලාවී මිණිමිණි මෙදස් (ලංකාව) රකුන් පසර නොවැ යගුල් සැවැදියා වීමැ (යකඩ මෙන් ශක්තිමත්) බලව හී (මෙයි) පරදෙස් පතිහු වැද කළ ගෙරළිම (ඔත්තුසේව) පරදෙස් හෙරළයින් වැ කළු (සටන්කරුවන්) හෙලරිම යෙහෙන මා රක්ඛ බදුනේ ඉදු බළ න්යාවේ සුරුවීමැ උහුන් ගස්සාකත හෙරල කොඩ (ශිල්ප) මේ නියාවේ පත් ඉරු කරමීහ.,

ඊ අගවලැ
රක්ඛ පදිගාන හෙරලය
රක්ඛ දිජතල හෙරලය
රක්ඛ සබල්ග හෙරලය
රක්ඛ කෝකේවුර හෙරලය
රක්ඛ පදිල්ලාග හෙරලය
රක්ඛ කන්දොරල හෙරලය
රක්ඛ අග්ගිලව හෙරලය
රක්ඛ යමර බන්දන හෙරලය
රක්ඛ වායිම් මොර හෙරලය
රක්ඛ රීරිකොලොස හෙරලය

යන සටන් ක්‍රම රාශියක් මෙහි සඳහන් වේ. මේ සටන් ක්‍රම හැම්බකම දැනට අභාවයට ගොස් ඇති බැවින් එවා ප්‍රගුණ කරන්නෙකුද නැත. යක්ෂ ගෝත්‍රික කාන්තාවන පවා අංගම්පුර සටන් ක්‍රම ප්‍රගුණ කළ බව රත්නපාලි බිසවගේ තොරතුරු වලින් හෙළිදරව් වේ. රත්නපාලි කුමරිය මහානාම රජුගේ බිසවයි. මහානාම රජු සතුරන්ට බියෙන් පලාගොස් සැගවී සිටියේ නීලගිරි වන අසපු වෙයි.

නීලගිරි ගමෙහි විසූ රත්නපාලි කුමරිය රජුට පළමුවෙන මුණ ගැසුනේ සැගවී දිය නාමින් සිටියදීය. ඒ බව වර්ගපූර්ණිකාවේ සවිස්තරව සඳහන් වෙයි.

එදවස රජුන් නසන්නට උප්පරවැට්ටි කළ වැද නීලගිරි පර්වතයෙහි සැගවී ගත උගු හා අග්‍ර මහේෂිකාවෝ සෙමද අන්තඃපුර ස්ත්‍රීහුද, අමාත්‍ය මඩුල්ලද, සේවා බන්ධරයෝද, වැදහ. එකල නීලගිරි ග්‍රාම වෙසවත් ජයේන්ද්‍රරක්ඛ සෙන්පතියා උගු වැවී බැදි මණ්ඩලයේ යක්ෂයින්ට බල පති වී. ඉර නැගී හෝරා ගිය කලැ සැනපිළිවු (වෙස්වලාගත්) මහානාම රජු නීලගිරි වාපී සිරි බලනනාහුය. ඊ කදිර සදිපියු වැදිල (දියනාන) සිරිමේඝා රත්නපාලි කුමාරිකාවුනගේ රූප සෝභාවෙන ආලසිත් උපදවා ගති. ඊ පුවත් මහානාම රජු හසුන්පතේ ඇවැටි කොර (සඳහන් කර) ජයෙන්ද්‍ර රක්ඛයන්ට අමාත්‍යවර ලවාදිනි. එපුවත දැක සංචිවු (සතුටු) යක් සෙන්පති උගු තනදුනිය රජුට බන්ධන ගත කිරීමට පසන්වී.,

මහානාම රජු නීලගිරි පර්වතයෙහි සැගව සිටි අවස්ථාවකදී දිය නැමට පැමිණි සිරිමේඝා රත්නපාලි කුමරිය මුණ ගැසී ඇත. රජු ඇය පිළිබඳ සිතක් පහල කර ගත්තේය. එවක නීලගිරි ග්‍රාමයේ ජයේන්ද්‍ර යක්ෂ සෙන්පතියාගේ දියණිය බව දැනගත් රජු සංදේශයක් මගින් එතුමාගේ කැමැත්ත ලබා ගත්තේය. සිරිමේඝා රජුට කැමැත්ත ප්‍රකාශ කලේ පොරොන්දු කීපයක් ඉටු කිරීමෙන් අනතුරුවයි.

ISBN 978-1-78280-808-4

භක්තිකයෝද සිටියා විය හැකිය. ඔවුහු මේ සිත් ඇදබැඳ තබන වන්දනා ක්‍රමය තම රටට ද ගෙන ගියහ.

මුස්ලිම් භක්තිකයන් අදුත් වන්දනා කිරීමේදී පොළොව සිපගැනීම චාරිත්‍රයක් වශයෙන් සිදුකරයි. ඈතට මුස්ලිම් දේශයක ඇති මක්කම පල්ලිය මෙරටට පැමිණි වෙළඳුන්ගෙන් ආරම්භ වූවක් ද යන්න සැකකල හැකිය. ශ්‍රී පාද වන්දනාව ලක්දිවට ගුරුපුරුදු වන්දනා ක්‍රමයකි. එහෙයින් ශ්‍රීපාදස්ථාන සතරම ලක්දිව පිහිටන්නට ඇත. මේ ස්ථාන ගැන සොයා බැලීමක් කොට නිශ්චය කරගන්නේනම් එයින් බෞද්ධ ජනතාවට විශාල සෙතක් සිදුවනු ඇත.

සිරි රත්නපාලි බිසව්

උනා වරළ රන් ඉර සඳ ඇරුව ලියයේ
රන් මිණි පයෝධර තඹරා පැළ[illegible]යයේ
උත්‍රාවතු මිණිවට ගත දී[illegible] ලියයේ
කන්දේ වෙහෙර බැ[illegible]පත්ත පා ලියයේ

යනුවෙන් ඉරුගල් යක්ෂ ගෝත්‍රික [illegible]ම්මා ජනකවි වල සඳහන් වන්නේ මෙම [illegible]ව ගැනයි. මානැව වැවේ මුත්ත[illegible]ථාන යන නම යොදා ඇත්තේ ද එතුමියගේ නමිනි.

සිරිමේෂා රත්[illegible]ාලි බිසව වීර කන්තාවක් ලෙසින් යක් වර්ගයා අතර කීර්තියට පත් තැනැත්[illegible]යකි. සටන්කාමීත්වයෙන් අගතැන්පත් ඇය රූප ශෝභාවෙන් ද සිත් ඇද බැඳ තබන්[illegible]යක වූවාය. යක්ෂ ගෝත්‍රිකයන් අතර භාවිතා වන සටන් ක්‍රම ඇය ද ප්‍රගුණ කළාය. [illegible]නාම රාජ සමයේ නීලගිරි යක්ෂ බල ප්‍රදේශයට අධිපතිව සිටි ජයේන්ද්‍ර රක්ඛ සෙන්පතිඳු[illegible]ගේ දෙටු දියණිය මෙතුමියයි. යක්ෂගෝත්‍රික ගණිතඥයකු වූ නබාධම්ම හිමියන්ගේ ද ශ්‍රී ල[illegible] සසුනේ යශෝදරා නිකායේ නිර්මාතෘවරිය වූ උත්තරාපාලි මෙහෙණියගේ ද සොයුරිය වූ ශ්‍රී රත්නපාලිදේවිය නීලගිරි දේවිය නමින්ද හඳුන්වනු ලැබුවාය.

මහිෂමාල වැදිරජුන්ගේ පරපුර නිල්මල් බිසව් නමින් මෙතුමිය දේවත්වයෙන් පුදන ලදී. ජන ගායනයක එන මෙම කවියෙන් ද නිල්මල් බිසව යන නමක් සඳහන් වෙයි.

ඔබත්, මොබත්, ඔබ චොරබොර වැවානෝ
අඩා දිය බවින මා වැලි ගගානෝ
දිය නොවිදේයි ඔබ චොරබොර වැවානෝ
නිල්මල් බිසව් දිය කෙලිනා වැවානෝ

යක්ෂ ගෝත්‍රිකයෝ සතුරන් ආ අවස්ථාවක ජීවිතක්ෂයට පත් කරනවා හැරෙ[illegible]ට ඔවුන් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමේ සටන් ක්‍රම ද භාවිතා කළහ. මානැව වරිගපූර්ණිකාවේ සටන් ක්‍රම කීපයක් පිළිබඳව සඳහන් වන්නේ මෙසේය.

ISBN 978-1-78280-808-4

[illegible]

ප්‍රකාශය. [illegible]
ස්වර්ණ සුබෝධි නම් කුමරා බිහිකළාය.

,ගැබ් ගෙනි බිසව් ස්වර්ණ සුබෝධි කුමාරයා වදන්නී. ළමුවැඩි වර්ග බැඳ විය වූ (ඇවැස්ස නෑනා) පත්මපාලි කුමරිය සරණ කර ගනී.

වර්ගපූර්ණිකාවට අනුව සිරිමේඛා රත්නපාලි බිසවගේ පරපුර රාවණා දක්වා දිවෙන ඉරුගල් බංඩාර නම් වූ පරපුරේ රාවණා රජුගේ දරු පරපුරෙන් පැවත ආ ඉරුගල් බණ්ඩාර නම් යක්ෂ ගෝත්‍රිකයාගේ පුත් උපතෙනුමිණිය ඔහු එවක නීලගිරි අධිපතියා විය. ඔහුගේ පුත් [illegible] ද ඔහුගේ පුත් නීලගිරිරක්ඛ යන සෙන්පතිවරුද නීලගිරිට බලපති වූහ. මොවුන්ගේ කාලයේ බුදුරජාණන් වහන්සේ ලංකාද්වීපයට වැඩම කළහ.

ඔහුගේ පුත් ඉන්ද්‍රරක්ඛ රකුන් පතිද එම දරු පරම්පරාවෙන් දසගත්ත රාජක යක්ෂ සෙන්පතියාද (මුනමුර සෑමිවරයා) ඔහුගේ දරු පරපුරෙන් මහානීල රකුන් පතිද ඔහුගේ දරු පරම්පරාවෙන් ජයේන්ද්‍රරක්ඛ යක්ෂ සෙන්පතියාද ඔහුගෙන් සිරිමේඛා රත්නපාලි කුමරිය ද බිහි වූවාය.

උරුවෙන්දුවිල ඉරුගල් පරපුර.

සිරිමේඛ රත්නපාලි දේවියගෙ දරු පරපුර

සිරිමේඛා රත්නපාලි දේවියගේ එකම දරුවා වන ස්වර්ණ සුබෝධි කුමාරයා පත්මපාලි කුමරිය හා විවාහ වීමෙන් ඔවුනට මාලිමිහ, සුළාඩි සුඩිම, වේශාඛ යන කුමාරවරු ජන්මය ලදහ. මෙයින් වැඩිමල් කුමරු මාලිමිහ නීලගිරි ගමරාළ නමින් වෙස් ගෙන (නීලගිරිග්‍රාම) මානැව ගමට පැමිණියේය. නීලගිරි ග්‍රාමයට මහානාම රජු කළ සේවාවට උපහාර වශයෙන් එම ගම මහානාම ග්‍රාම යනුවෙන් නම් කෙරිණ පසු කළෙකදී මානැව යන නාමය ජන ව්‍යවහාරයට එක්විය.

,රකුන්ගෙ යස ශ්‍රීනිය සිරිමේඛා රත්නපාලි මහේෂිකාවුන් වහන්සේ හා සමසිරින් වැජඹෙන්නේ එකල්හි රජු මෙහෙසියගෙ බන්ධු වර්ගයා (නෑ පිරිස) සහ පිරිවරා වර්ගසහා මණ්ඩපයේ වැඩ හිඳ නීලගිරි ග්‍රාම මහානාම ග්‍රාම ලෙසින් අඹකාලව්ව එරජුන්ට තේවාලු සේවා බන්ඩරයන්ද උදෙසා ගම් කෙළෙවුන පනා දීනි. ඒ රාජ පරිවාර ග්‍රාමයෝ වෙත්., (වර්ග පූර්ණිකාවෙන්)

ගමෙහි සේවා කටයුතු සඳහා පරිවාර ගම්ද ඉදි කළේය. පසු කලෙක නීලගිරි කන්ද මහානාම කන්ද ලෙසත් ඉන් පසුව මානැ කන ද නම්වුන ව්‍යවහාර විය. මානැ කඳු මිටියාවතෙහි මහානාම රජු ඉදිකළ මහා පිරිවෙන කච්ලායපාලි. මහාපාලි විසෝවරු භාවනාකළ තපෝ භූමිය ද පිහිටා ඇත. විජය රජුගේ සේනාව පැන ගැනීම සඳහා පොකුණට එන විට කුවේණිය දුටුබව පවසයි එම සිදුවීම සිහිගැන්වීමට මහානාම රජු නීලගිරි බිසව් කඳුර දියුණු භාවයට පත්කළේය. මෙය දැනට ලංකාවේ හමුවී ඇති විශාලතම පොකුණයි. මානාපවී පිරිවෙනෙහි නටබුන් අතර මේ සුවිශාල පොකුණ අදටත දැකගත හැකිය. මානැව කන්ද මුදුනේ ඇති මුණමුර පුස්තක ලෙන ද්‍රමිළ ආක්‍රමණයේදී විනාශයට පත්විය. මෙම ගල් ලෙන අදටත් දක්නට ඇත යක්ෂ ගෝත්‍රික මුණමුර සෑමිවරයා මෙම පුස්තක ලෙනෙහි නිර්මාතෘවරයා ලෙස ප්‍රකාශ වේ. දසගත්ත රාජක යක්ෂ සෙන්පතිතුමා හඳුන්වන ලද්දේ මුණමුර සෑමිවරයා යන ගෞරව නාමයෙනි.

ISBN 978-1-78280-808-4

රත්නපාලි දේවියගේ වැඩිමහල් සොයුරු නබාධම්ම හිමියන්ගේ මුලිකත්වයෙන් ගින්නෙන් බේරා ගත් මෙහි ග්‍රන්ථ අතර මේවා විශේෂත්වයෙන් සැලකිය හැකිය.

කවිලාශපාලි සැදිය (කවිලාශපාලි දේවිය විසින් රචිත ග්‍රන්ථයකි)
ඉරුගල් තෙදය (උසහස්ත රාජක ඍෂිවරයා ලියු වෛද ග්‍රන්ථයකි)
මුහුන් දෙයුර (විකුණ්ග හදු යක්ෂ සෙන්පති රචනා කල වෛද ග්‍රන්ථයකි)
හවඅග්‍ර තන්ත්‍රය (කවිලාශපාලි දේවියගේ දහම් ග්‍රන්ථයකි)
රකුන් සැරය (කවිලාශපාලි දේවිය රචනා කල ග්‍රන්ථයකි)
සිලිබියා පත (නීලගිරි යක්ෂ සෙන්පතියා විසින් රචිත වෛද ග්‍රන්ථයකි)
විශකුම්භණ හැදිය (කවිලාශපාලි දේවියගේ දහම් ග්‍රන්ථයකි)
ඊරී කොලොස (කවිලාශපාලි දේවියගේ නීති ග්‍රන්ථයකි)
උත්‍රාවක්‍ර සැදිය (කවිලාශපාලි දේවිය විසින රචිත සමාජ විදා ග්‍රන්ථයකි)
නීලගිරි සන්නය (ඉන්දුරක්ඛ සෙන්පතියා විසින් රචිත දහම් සන්නයකි)
ගිරිකණ්ඩ ජල සැදිය (නබාධම්ම හිමි විසින් රචිත ගණිත මුල ධර්ම ග්‍රන්ථයකි)

මානැවේ පදිංචි වු මාලිම්භ කුමාරයා කෘෂිකර්මය දියුණු කිරිමෙහිලා මහත් වෙහෙසක් ගත්තේය. ජනයාගෙන් හිස් වු ග්‍රාමය ඥාතීන්ගෙන් නැවත ජනාවාස කලේය. ඒ සඳහා වැදි ජනතාවගෙන් ද උදව් ලබාගෙන ඇත. මාලිම්භ කුමාරයාගේ පරපුර හැම විටම නම් දෙකකින් පෙනී සිටි බැවින් පරපුරේ පැවැත්ම ගැන විමසිලිමත් වීමෙන් සිටිබව සනාථ කරයි. මාලිම්භ කුමරුගේ පුත් සංජීව කුමරු ගිරි බංඩාර නමින් ද, ඔහුගේ පුත් විපුල්ලම්භ කුමරු රනකොත් බංඩාර නමින් ද, ඔහුගේ පුත් පියුමල් බංඩාර ගිරිඅප්පු ගමයා නමින්ද, ඔහුගේ පුත් සිරිනාථ බංඩාර කලුහාමි ගමයා ලෙසින්ද, ඔහුගේ පුත් චන්ද්‍රගිරි බංඩාර රංහාමි ගමයා නමින්ද, ඔහුගේ පුත් සත්බෝ බන්ඩාර මුතුහාමි ගමයා නමින්ද, ඔහුගේ දරුපරපුරෙන් පැවත ආ පියුමලී කිරිමැණිකා කුමරිය බිහිවුයේ මහනුවර යුගයේදීය. තම පරපුරේ කාන්තාවන්ගේ ආවේනික ගති පියුමලී කිරිමැණිකා තුළද තිබුණි. රාජාධි රාජසිංහ පාලන යුගයේ දේශයට ද්‍රෝහිකම් කළ කප්පිලි ජාවෝ නම් ප්‍රචන්ඩ ලන්දේසී සෙන්පතියා අල්ලා රජුට බාරදීමට චරිගසභාවෙන් අවසර ගෙන එම වීර ක්‍රියාව ඉටු කළාය. එයට උපහාර වශයෙන් ඇයගේ පරපුරට රටේ ක්‍රියාත්මක වන සියලු බදු වලින් නිදහස්ව රාජකරුනා යන නම්බුනාමය ද එම රජුන් විසින් පිරිනමන ලදී. ඇයගේ දරු පරපුරෙන් පැවත ආ මෑතක විසු රාජකරුනා මුදියන්සේලාගේ කිරිබංඩා මහතා විසින් පරපුර සතු සංනස්පත්‍රයක් කෞතුකාගාරයට පරිත්‍යාග කලේය. කිරිමැණිකාගේ අභීත ක්‍රියාවට උපහාර පිනිස කරුණාගල මාවත ඉදිකෙරුනි.

රාවණ වංශ පුස්තක සංරක්ෂණාගාර සතුය

ISBN 978-1-78280-808-4

නීලගිරි පව්වේ ඇති ඓතිහාසික ස්ථාන

දීගු කළක සිට ජනාවාසව පැවති මේ ප්‍රදේශයේ තවමුත් වූ ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් දැක ගත හැකිය. නිදන් හොරු විසින් මේ ස්ථාන දැනටමත් විනාශ කර ඇත. තපෝ භූමියේ ඇති ගග කොළ වලට කර ඇති හානියද, අති විනාශය මේ වටිනා ස්ථාන රැක ගැනීම සඳහා කාගෙත් අවධානයට යොමු කරමි.

1) විශකුම්භණ දාගැබ

මෙය බුදුන් වහන්සේ දේවියට ප්‍රකාශ කරන ලද විශකුම්භණ ශාඩියෙහි අන්තර්ගත ඖෂධීය ගුණය ඇතුළත් කර සකසන ලද වෛද්‍ය ග්‍රන්ථය තැම්පත්කර සාදන ලද චෛත්‍යයකි. මිතෑ සඳු මුදුනේ බටහිරට ඇති කළුගල නම් ස්ථානයෙහි අදටත් මෙය දැකගත හැකිය නිදන් හොරුන් විසින් මේ චෛත්‍යද විනාශ කර ඇත

2) චතුරකේනුවරය

මෙය මානාවේ පිරිවෙනේ වෛද්‍ය මධ්‍යස්ථානය යැයි ප්‍රකාශ වේ පිරිවෙනට ඇතුළු වන නැගෙනහිර දෙසින ඇති ප්‍රධාන දොරටුව අසළ මේ ස්ථානය පිහිටා ඇත පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර ඇති බැවින මෙය දැක බලා ගත හැකිය. මෙය අංග 05 කින් යුක්ත විය.

වෛද්‍ය මධ්‍යස්ථානයක ස්වභාවය තෙරුම් ගැනීමට මෙය හොඳම නිදසුනකි.

1. නිගාත කේනුවරය - සර්වාංග වෛද්‍ය මධ්‍යස්ථානය
2. ද්‍රාග්‍රීල කේනුවරය - විෂ වෛද්‍ය සේවා පවත්වාගෙන යන මධ්‍යස්ථානය
3. යවාකර කේනුවරය - සැත්කම් කරන ස්ථානය
4. සසාල කේනුවරය - ඔසු සේවා බෙහෙත් ගබඩාව

කවිලාශ සර්වජා නම් වූ අද්භූතජනක ඔසු ගස පිහිටා තිබුණේද මේ ස්ථානයේය.

3) කවිලාශපාලී බෝධිය

කවිලාශපාලී රැජිනට උපහාර පිණිස රෝපනය කළ බෝධියකි.

රාවණ වංශ්‍ය පුස්තක සංරක්ෂණාගාරය සත්‍යය

ISBN 978-1-78280-808-4

4) මහානාම පව් පිරිවෙන	යක්ෂ ගෝත්‍රිකයන්ගේ වෙසමුනිධරණිය නම් ශිල්ප මධ්‍යස්ථානය තිබූ ස්ථානයයි. රාවණා සමයේ මේ ස්ථානය යුද කඳවුරක් වශයෙන් පැවතුනි. සීතා දේවිය මේ ස්ථානයේ සඟවා තිබූ බව ප්‍රකාශ වේ. මෙහි සිට රතුන්ගිර (රිටිගල) දක්වා රහස් මාර්ගයක්ද තිබුණි. චරිග පූර්ණිකාව එය හඳුන්වන්නේ භුවස්තලුතය නමිනි. මහානාම රජ සමයේ ආරම්භවුණ මේ පිරිවෙන ඉතා දීර්ඝ කාලයක් පැවතුනි. මෙහි වැඩ සිටි භික්ෂුවක් සීගිරියේ ගී දෙකක්ද රචනා කොට ඇත.
5) තබාධම්ම කුටීරය	යක්ෂ ගෝත්‍රික තබාධම්ම හිමියන්ගේ විනය බල මන්ඩලය පැවති ලෙණ මේ නමින් හැඳින්වේ.
6) මුනමුර පුස්තක ලෙණ	මුණමුර ඍෂිවරයා විසින් ආරම්භ කරන ලද පොත්ගුලකි. මෙහි යක්ෂ භාෂාවෙන් රචිත ධර්ම ග්‍රන්ථ රාශියක් තිබුණි. අටුවා, වෙද හා තවත් ග්‍රන්ථ ද එයට ඇතුළත්ය.
7) උත්තරපාලි මෙහෙණවර	යක්ෂ ගෝත්‍රික උත්තරාපාලි භික්ෂුණිය විසූ ආරාමය මේ නමින් හැඳින්වේ. ඇය සිරිමේඝ රත්නපාලි බිසව ගේ සොහොයුරියකි. යශෝදරා භික්ෂුනී නිකායේ මූලස්ථානය වන්නේද මෙම මෙහෙනවරයි.
8) නීලගිරි බිසෝ මාලිගය	සිරි රත්නපාලි බිසව විසූ ස්ථානයයි. මානාකන්දට බටහිරින් තෙලටිය ඔසුයාය නමින් අද හැඳින්වෙන ස්ථානයේ පිහිටියේය.
9) නීලගිරි බිසව් කඳුර	භික්ෂුන්ගේ ප්‍රයෝජන සඳහා සිරිරත්නපාලි දේවියගේ ඉල්ලීම මත මහානාම රජු විසින් ප්‍රතිසංස්කරණය කරණ ලද පොකුණකි.
10) සීමි කුටය	සීමා මාලකය විනය කර්ම කිරීම සඳහා භාවිතා කල ස්ථනයයි.
11) ඔරුමාල පත්තිනි ගිර	පත්තිනි දේවියට පූජා පැවැත්තූ ගල් තලාව මෙය මානැව වැවට හසු වී ඇත.

ISBN 978-1-78280-808-4

12) රාමත්සනා ගල	රජ රකුසන් පිදුම කළ ස්ථානය
13) බිම්බා ජේරි පිදූ ස්ථානය	යශෝදරා දේවී පිදූ ස්ථානය මෙය පේර්වතාවට කරන ලද උපහාරයකි
14) සුවක් ජේතිය	මෙය පසෙකි බුද්ධ කාලයේ යක්ෂ ගෝත්‍රිකයන් හොඳින් ඇල්වූ පසෙකි බුද්ධ පරිනිර්වාණයෙන් පසු සිවා දමන ලද.
15) මහානාම තිලබ තුරය	රාජ්‍ය සබඩාව
16) රාජ මහිලාංගනය	අන්තඃ පුරය
17) ධ්‍යාන ලෙන් ගිර (වසාබු ගල් කන්ද)	සිරි රත්නපාලි දේවිය විසින් නීලවේලද දෙමළ සෙන්පති ඝාතනය කළේ මෙම ස්ථානයේදීය.
18) සළුවඩනා ගල	රජතුමාගේ සළු සෝදා වැනූ ස්ථානය ලෙස සැලකේ
19) පලදනා ගල	රාජ බිසෝවරු මානැව් වැවේ දිය නැමට පැමිත ආභරණ ගලවා තබන ස්ථානය යැයි ප්‍රකාශ වේ
20) රකුන් හුජම ගල (වී බැන්ද ගල)	යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආරක්ෂා සේවා පැවැත් වූ ස්ථානයකි
21) මහානාම සළඹ තුරය	ශිලා ලිපියකි
22) මුසනාව	සොහොන් බිම
23) කරුණාගල මාවත	රාජාධිරාජසිංහ රජු විසින් රවිරෙහෙලාන යක්ෂ ගෝත්‍රයට උපහාර පිණිස සාදන ලද්දකි

යක්ෂ ගෝත්‍රික සිරිත් විරිත්

යක්ෂ ගෝත්‍රිකයෝ ආදිතම යුගයේ සිට වැඩිහිටියන්ට සහ ස්වභාවි වස්තූන්ට ගරු කිරීමෙහි චාරිත්‍ර ඉටු ක. ආදි මුතුන් මිත්තන් පිදීම චාරිත්‍රය ආරම් වූ යේ සැමියරුන් වශයෙන් සිට මිය ගිය තම ඥාතීන්ට ගරු කිරීමට පටන් ගත් සිටය. බුදු දහමේ ආගමනය ලැබීමත් සමගමය මේ තව දුරටත් කැපී පෙනෙන චාරිත්‍රය

ISBN 978-1-78280-808-4

බවටත් පත් විය. මොවුන් පුද්ගලයන් හතර දෙනෙකුට ගරු බුහුමන් දැක්විය. මෙයිනුත් ඉතාමත් ගෞරවනීය පුද්ගලයා ලෙස සැලකුවේ බුදුන්වහන්සේය. උන් වහන්සේ වැඳුම් පිදුම් කිරීම උදෙසා නෙලුම් මල සංකේතවත් කරණ ලද ශ්‍රී පාද ලකුණ යොදා ගත්හ. ප්‍රතිමා කලාව ආරම්භ වීමට පෙරාතුව ශ්‍රී පාද ලාංඡනය හා වජ්‍රාසනය බුදුන්වහන්සේ වෙනුවට වැඳුම් පිදුම් කිරීමට භාවිතා කළහ. මේ පූජනීය වස්තූන් දෙකෙන් බුදුන් වහන්සේගේ පළමු ලංකා ගමන සංකේතවත් කරයි. උන්වහන්සේ ප්‍රථම ගමනේදී යක්ෂයන් දමනය කල බවත් සඳහන් වෙයි. වරිග පූර්ණිකාවට අනුවම එම අවස්ථාවේදී උන් වහන්සේ වැඩ හිඳි වජ්‍රාසනය සහ ශ්‍රී පාද ලාංඡනය ඔවුන්ගේ මහානර්ඝ වස්තුවක් විය. ප්‍රතිමා බිහිවීමට පෙරාතුව ලක් දිව පුරා මේ සංකේත දෙක පමණක් දැකිය හැකි වන්නේ එබැවිනි. බුදුන් වහන්සේ වැඩහිඳි වජ්‍රාසනය තැන්පත් කොට සාදන ලද වාජ්‍රාසන චෛත්‍යය අදටත් නටඹුන් අතර දැකිය හැකිය. බුද්ධ කාලයෙහි මෙරට සිටිය යක්ෂ ගෝත්‍රික නායිකාවක් වු කවිලාශපාලි බුදුන් වහන්සේ වෙනුවෙන් වන්දනා කිරීමට විෂ කුම්භණ නම් චෛත්‍යයක්ද බුදුන් වහන්සේ සිහි ගැන්වීම උදෙසා උන් වහන්සේගෙන් ලබා ගත් වම් නිය ධාතුව තැන්පත් කළ නබා වෙහෙර නම් චෛත්‍යක්ද ඉදි කළාය. මේවා බුදුන් වහන්සේ වෙනුවෙන් ගොඩනගන ලද අප්‍රකට පැරණි චෛත්‍ය ගණයට වැටේ.

රහතන්වහන්සේලාට ගරු කිරීම සඳහා නෙළුම් මල රහිත පාද ලාංඡනය යොදා ගෙන තිබේ. මෙයින් පෙනෙන්නේ යක්ෂ ගෝත්‍රිකයන් රහතන් වහන්සේලා වැඳ නමස්කාර කිරීම සඳහා ද සංකේතයක් යොදා ගෙන ඇති බවයි. වර්තමානයේ අගසව් දෙනම සඳහා ප්‍රතිමා නෙලීමක් හැරෙන්නට ඊට පෙරාතුව උන්වහන්සේලා නමස් කාර කිරීමට වෙනත් සංකේතයක් යොදා ගෙන ඇත් බවක් දක්නට නොලැබේ

යක්ෂ ගෝත්‍රිකයන්ගෙ සිරිත් විරිත් අතර ආදි මුතුන් මිත්තන් පිදීමේ චාරිත්‍රය ද තිබුණි. එය වැදි ජනතාවගේ මළවුන් පිදීමට තරමක් සමානය මෙහිදී යක්ෂ ගෝත්‍රකයෝ හින්සා කාරී පිළිවෙතක් අනුගමනය නොකොට වසරකට වතාවක් බත් මාලා පිදීමේ චාරිත්‍රය අනුගමනය කළහ. මේ පූජාවට ඔවුන් මහත් භක්තියෙන් සම්බන්ධ වුයේ මිය ගිය මුත්තන් නමින් ජීවත් කරලීමට මහත් උපකාරයක් කළ බව විස්වාස කරන බැවිනි. මුතුන් මිත්තන් පිදීමේ සංකේතයවුයේ ස්ව සතිකයයි.(ගෝරාපාසලම) සිත දියුණු කල යක්ෂ ගෝත්‍රිකයන් බ්‍රහ්මත්වයට පත්වන බව ඔවුන්ගේ විශ්වාශයයි. සමාජය ඉහළ සේවාවක්කල අයව කෘත වේදීව දේවත්වයෙන් පිදීමට හුරු පුරුදුව ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන මේ චාරිත්‍ර විදිය නිසයි. පැරණි ලාංකිකයෝ ගරු කල යුත්තන්ට ගරු කලයුතු බව හොඳින් දැන සිටියෝය. රාජකරුණා වංශික ඉරුගල්බණ්ඩාර පරපුරෙන් එන මානැව, ගන්තිරියාගම වසන ඇතැම් පැරණි උදවිය අදටත් මේ චාරිත්‍රය ඉටු කරනු ලබයි. මේ ගම්වල ඇතැම් මපිවරු බතක් ඉදි බෑමට පෙරාතුව හැඳි කුරෙන් බතෙහි ස්වස්තික ලාංඡනය අඳිනු ලැබේ. ගමනක් යෑමටපෙරාතුව ස්වස්තික ලාංඡනය සංකේත කිරීම භාග්‍ය උදාකර දෙන්නක් ලෙස ඔවුහු සැලකූහ. මේ චාරිත්‍ර විදිය ක්‍රිස්තියානි භක්තියෝ දෙවියන් සිහි කිරීම සඳහා කුරුසය ඇඳ ගැනීමට සමාන ක්‍රියාවක් වු ස්වස්තික ලාංඡනය යක්ෂගෝත්‍රිකයනගෙ ආත්ම භක්තිය ලෙසද සැලකූහ. එතුමන්ලා දේව සංකල්පය ගොඩනගාගෙන ඇත්තේ ද අපේ ආදී මුතුන් [illegible]ාන් වන්දනා කිරීමෙහි චාරිත්‍රයට සමාන අන්දමින්ය. සිත දියුණු කිරීමෙහි [illegible]හාප කාරී භාවනා ක්‍රම අප අතර භාවිතා වු බැවින් එය විදර්ශනාව දක්වා වැඩි [illegible] කර ගැනීමට බුදු දහමේ ආභාෂය අපට ලැබුණි. විෂකුම්භණ සූත්‍රයෙහි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය

ISBN 978-1-78280-808-4

කව්ලාණ පාලි දේශනා කළ විදර්ශනා ක්‍රමය අනය කෞශල්‍යයකි. බුද්ධ කාලයෙහි දීම ලක් දිව බෞද්ධයන් සිව්ගේ නම් භික්ෂු සඟන මෙරට නොපැවතියේ මන්දැයි හැඟවුවකට ඇඩු දැක්වෙනෙකි. මාර්ග ඵල අවබෝධ කර ගත් කව්ලාණපාලිගද බුදුන් වහන්සේ වෙනුවෙන් බ්‍රහ්මචාරීව ආරාමගත වී සිටි ගාය. මෙහින් ලෙහෙන්ගේ මාර්ග ඵල ලාභී මොහෙවින් වහන්සේලාත් ලාංකාවේ වැඩ සිටි බවයි. මෙරට බුද්ධ කාලීන ඓතිහාසික තොරතුරු අප්‍රකටව පවතින්නට විවිධ හේතු බලපෑවේය.

විදේශ ආක්‍රමණ හේතුවෙන් බෞද්ධ ධර්ම ග්‍රන්ථ විනාශයට පත් වීමත් යක්ෂ ගෝත්‍රිකයන් භාවිතා කළ ඔවුනට ආවේනික වූ භාෂාවෙන් ධර්මග්‍රන්ථ රචනා කර තිබීමත් හේතු කර ගෙන බෞද්ධ තොරතුරු සොයා ගැනීමට දුෂ්කරව පවතී. උතුරු කරය දක්වා ව්‍යාප්ත වී ඇති බෞද්ධ ආරාම නටබුන් වලින් පෙනී යන්නේ මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කිරීමටත් පෙරාතුව ලක් දිව භික්ෂූන්වහන්සේලා වැඩ සිටි බවය. බුදුන් වහන්සේ ලක් දිවට වැඩම කළ ගමනයන් පිළිබඳව ඉතිහාසයෙහි නිවැරදිව සඳහන් වී නොමැත. එසේ වුවානම් අපි නිවැරදි ඉතිහාසයකට උරුමකම් දක්වන්නෝවෙමු.

රටේ රජතුමාට ගෞරව කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ සඬුව නම් සංකේතයයි. ජනතාවගේ ප්‍රධානියා ඊශ්වරයකුට සමාන තැනැත්තෙකු බැවින් එතුමාටද ගුරු බුහුමන් දැක්වූහ. වරිග පූර්ණිකාවේ සඳහන් වන අන්දමට ධර්ම හා වෛද්‍ය ග්‍රන්ථ විශාල වශයෙන් රචනා කොට ඇත්තේ රටේ ජන නායකයා විසිනි. එතුමා බහුශ්‍රැතයෙකු බව මෙයින් මෙයින් පැහැදිලිය. බුදු දහමේ ආභාෂය ලැබීමට ප්‍රථම එක්තරා පිළිවෙත ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කළ ඔවුන් ගසක කොළයක් හෝ පොත්තක පවා ලබා ගන්නේ එවාට ගෞරව දැක්වීමෙනි. මෑතක පවා එම චාරිත්‍රය ගැමියන් අතර දක්නට ලැබෙන්නේ යක්ෂ ගෝත්‍රකයින්ගෙන් ලද ආභාෂය හේතුවෙනි. බෙහෙත පිණිසයක අවශ්‍ය වූ විටක ගසක් ළඟට යන ගැමියා එය වටා තෙවරක් පැදකුණු කොට නමස්කාර කිරීමෙන් අනතුරුව ගසේ කොළ පොතු ලබා ගනී. සත්වයා සුව පත් කිරීමෙහි අසීමිත ශක්තියක් ගහකොළ වල ගැබ් වී ඇති බැවින් එවාට ගරු කිරීමෙහි යක්ෂගෝත්‍රිකයන්ගේ ප්‍රතිපත්තිය බොහෝ කොට දැඩිව පැවති අන්ධ භක්තියෙන් යුතුව කරනු ලබන වෘක්ෂ වන්දනාවට හාත්පසින්ම වෙනස්ය. බුදුරජාණන් වහන්සේ ජය ශ්‍රී මහා බෝධියට අනිමිසලෝචන පූජාව කළේ තමන් වහන්සේට සෙවන දුන්නාට කළගුණ සැලකීමක් වශයෙනි. තමන් ජීවත් කරවීමට උපකාරී වු වෘක්ෂයනට ගරු කිරීමෙන් සිදු කරනු ලබන්නේද කෘතවේදී බවයි.

දස පද්දුර ක්‍රියා

යක්ෂගෝත්‍රික සිරිත්විරිත් වලට පටහැනිව ක්‍රියා කිරීම දසපද්දුර ක්‍රියා නමින් හඳුන්වනු ලබයි. අපේ පැරණ්නන් භාවිතා කරන මේ වචනයෙහි අර්ථ දන්නේ නම් ඒ අත ලොස්සක් පමණී. දෛනික ජීවිතයේ නිරන්තරවම සුරැකිය යුතු කරුණු 10ක් නොසලකා හැරීමෙන් තමන් සමාජයේ අප කීර්තියට පත් වන බව මෙයින් කියැවේ.

1. කුරුත - මව්පියන්ට නොසලකා හැරීම
2. යාගිත - චපල බව

ISBN 978-1-78280-808-4

3 [illegible]
4 [illegible]
5 [illegible]
6 [illegible]
7 [illegible]
8 [illegible]

9 [illegible]
10 [illegible]

[illegible]

1 ගෙඩි හැට්ටය - මෙය මංගල උත්සවය සඳහා [illegible]

2 නාග කන්‍යා හැට්ටය - මෙය යෞවනය හා පතිව්‍රතාවය නියෝජනය කරන්නා වූ ඇඳුමකි අවිවාහක කාන්තාවන් අතර ජනප්‍රිය වස්ත්‍රයකි. [illegible] උපදෙස් දෙන මෙම ඇඳුම පැරණි කුලවත් කාන්තාවන් අතර ජනප්‍රියව පවතී

3. උත්තරා ඵේලය :- මෙය රාත්‍රී යහන්ගත වීමට ප්‍රථම අඳින ඇඳුමකි. තනන වූ ලඩුකය ආවරණය කර ගැනීමට යොදා ගන්නා අන්දමින් සකස් කර ගන්නා වස්ත්‍රයකි. යක්ෂ ගෝත්‍රික චාරිත්‍ර අනුව අනඟ යහනේදී ඇඳීමට දෙන්නේද මේ වස්ත්‍රයයි. කාන්තාවන් මෙය විශේෂ වස්ත්‍රයක් ලෙස සලකන අතර මෙය භාවිතා කිරීමට ප්‍රථම පයොදර අභරණයද පළඳිනු ලැබේ.

4. කුමරි ඉඟ තෙරිය :- ස්ත්‍රියකගේ ඉඟ කොටසේ සිට පාද ඇඟිලි දක්වා ආවරණය වන අයුරින් වස්ත්‍රය ඇඳ රැලි 14 කින් යුක්තව ඉඟ තෙරිය සකසාගත යුතුය. මෙය කුමරි ඉඟ තෙරිය වශයෙන් හඳුන්වනු ලැබේ. අවිවාහක කාන්තාවන් පමණක් මෙය භාවිතා කරති. විවාහක කාන්තාවන් මෙය ඇඳීම දඬුවම් ලැබිය යුතු වරදකි. කුමරියගේ විවාහ දිනයේදී අනඟ යහන මත මධු සමයෙන් පසු කුමර ඉඟ තෙරිය ඇය වෙතින් ඉවත් කරනු ලබයි. මෙයින් පිළිඹිමු කෙරෙන්නේ කුමරි බ්‍රහ්මචාර්යාවයි.

ISBN 978-1-78280-808-4

[illegible]

5 [illegible]

6 [illegible]

7 [illegible]

8 [illegible]

[illegible]

[illegible]

6 ඇතුළු

1. තර්ජිත කරාවත
2. ජාතික කරාවත
3. දූතතම්බ කරාවත
4. පුච්චිස කරාවත
5. පුෂ්ප කරාවත
6. අමිත කරාවත
7. සෝර කරාවත
8. කුකුට කරාවත
9. ශාමිත කරාවත

පිළිවෙලින් නවග්‍රහයනට පිළියම් යොදන බව මෙහිත පැවසෙ. [illegible] සමඟ සුවඳ වාහනය වන මේ විශේෂ පත් වර්ග ස්වභාව පරිසරයේ වෙනස් වීමත් සමඟ වඳවී ගොස් ඇත එමෙනම [illegible] භාවිතාවන පමි කෙස්වල නීරෝගිතාවය ආරක්ෂා කර ගැනීමට හා සුවඳ ගැන්වීමට මේ පත් වර්ග භාවිතා කර

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සත්‍ය

ISBN 978-1-78280-808-4

ඇත. ඔවුන් හොඳින් කෙස් සකස්කර පිරා කෙස් වල නිරෝගී තාවය රැක ගැනීමට ඖෂධ විශේෂ භාවිතා කළ බව මෙයින් තහවුරු වෙයි. ඇලිස්ස පත් වර්ග යොදාගෙන පැදුරු වර්ග වියාගෙන ඇත. ඇලිස්ස පත් වලින් වියාගත් පැදුරක් අවුරුදු දාහක් වුවද තබා ගත්තත් එයින් ප්‍රසන්න සුවඳක් වහනය වන බව ඔවුන් පවසයි. ඒ බව වර්ග පූර්ණිකාවේ සඳහන් කරන්නේ මෙසේය.

“රකුත්ගිර උදාරින දැල්ලාට කඳුරු බඩ පිඳිවැ ඉසංචිවරවැ පුත ඇලිස්ස නම වට කුහුමිල (පත) හෝත (යමෙකුගේ) කඳුල (සිරුර) සුපුරද්ද (ස්පර්ශ) වූ කලැ ඊ මැ එහි තම්බිරියම පුසුඹ (පුදුම සුවඳ) උපත ඊ සොවිට ආවඩ පුදුස්ස වන්නේ.”

රකුත් ගිර (රිටිගල) නැගෙනහිරින් දැල්ලාට නම් වූ පොකුණෙහි අගල පිදී සතුටු වූ වැඩුන ඇලිස්ස නම් පත වර්ගය යමෙකුගේ ශරීරයට ස්පර්ශ වූ විට සුවඳක විහිදේ. මේ පත විශේෂය උපයෝගී කරගෙන වයන පත්නම් රටා විශේෂයක් ද සඳහන් වේ.

එමෙන්ම මේ පත වර්ගය කිසියම් ඖෂධ විශේෂයක දමා පදම් කරගත හොත් අවුරුදු දාහක් වුවද එහි සුවඳ ආරක්ෂා කරගත හැකි බව සඳහන්ය. එම ඖෂධ පිළිබඳව වර්ග පූර්ණිකාවෙහි මෙසේ සඳහන වෙයි.”

ඇලිස්ස තුනුමුල දඹපත වටාල කිනිති මිහිනි සුපත කොසුල පප්පල මුසුවමල (මුසුකර) ඊ මැ (එය) තුවක සකයාමක් (මාසයක) බුජම් කාල වී කලැ ඊතුර (එම සාරය) එකු කුදුස්කානුධාවේ (වසර දහසක සඳහන වේ.)

මෙය ඖෂධ පත විශේෂය සාදා ගනිමින් මසක් පමන පදම් කරගත් විට අවුරුදු දහසක කලක් එහි සුවඳ රැකෙන බව පවසයි. ඇලිස්ස පත් යොදා ගනිමින් තවග්‍රහ ශාන්ති සඳහා වූ පතනම් රටා ක්‍රමයක් යක්ෂ ගොත්‍රිකයන් සතුව තිබූ බව කියැවෙන වැකිය

ඇලිස්ස තුනුමුල කුලස්ස කරලුයේ නව දසා පතන සිද්ධිබල වග ඉසිවග ඉසිම්සක වන ඊ වග මෙසේ පතතාරු කරම්හ. රක්බ සප්පිත සුමුල වත්තා රවිඳුනිටවී මැ.

යක්ෂ වර්ගයා අතර ඇලිස්ස පත වර්ගය කෙතරම් ජනප්‍රියද කිවහොත් *රක්ව සදියම* නම් වූ ජන කවියක මෙසේ සඳහන් වෙයි.

මොරතු පුසුබ මොර
වඩල අතිල මුකාමුර
කීවද සරි වානත
ඇලිස වියක තුහුමුල
පෙවෙස රකගන

නිවසෙහි විවේකීව සිටින කාන්තාවන් විවිධ වූ රටා නිර්මාණය කරමින් පත් කර්මාන්තයේ යෙදෙමින් සිටි අයුරු මේ තොරතුරු වලින් මොනවට පැහැදිලිය.

ISBN 978-1-78280-808-4

ගිවිසුම් ආභරණ

යක්ෂ ගෝත්‍රික හැම කාන්තාවක් විසින්ම ගිවිසුම් ආභරණ වශයෙන් සැලකෙන ධර්මතා 7 අයුරින්ම සුරැකිය යුතුය. ඉතාම ගැඹුරුම ධර්ම අර්ථයක් ගැබ්වුණු ආභරණයකි උත්‍රුවක්‍රවට මාලාභරණයයි. මේ වචනය ඇසූ සැනින් අප සිහියට එන්නේ උරවක්‍රමාලයයි. උරවක්‍රය ගෙල පළඳවනු ලබන්නේ ඔහුගේ ප්‍රාණයට හානියක් සිදුවීම ගෙල කැපී වේදනා ගෙන දෙන ආයුධයක් හැටියට උරවක්‍රය අප හඳුනාගෙන ඇත. උත්‍රාවක්‍රමාලාභරණය යක්ෂ ගෝත්‍රික කාන්තාවන් විශ්වාසයෙන්, ගෙල පළඳින ආභාරණයකි. මේ ආභරණයෙන් පතිව්‍රතා ධර්මය සිහි කෙරෙයි. මෙය එව හෙයින් ඉන් ආභරණයකි. සැම වටයකටම ධර්මීය අර්ථයක් දක්වා ඇත.

එමනිසා මෙහි දිව්‍යමය බලයක් ඇති බව වංශික කාන්තාවෝ විශ්වාස කරති. තමන්ගේ වත්කම් වල හැටියට වටිනා ගුණයකින් මේ ආභරණය සාදා ගත හැකිය. මෙය බෞද්ධ සංකල්පය මත තීම කරන ලද ගිවිසුම් ආභරණයකි. එසේ වන හෙයින් ඉන් මෙම ආභරණය ගෙල පැළඳූ විට ලිය ඉන්ද්‍රිය දමනය ආවරණය වෙයි විශ්වාසයයි. පුරුෂයා විසින් ගෙල පළඳින මෙම ආභරණය දිවි හිමියෙන් සුරැකිය යුතුය. උත්‍රාවක්‍රවට ආභරණය පැළඳූ කාන්තාවන් දෙස රාගික හැඟීම් වලින් වෙනත් අය නොබලන බව පැවසේ. උත්‍රාවක්‍රවට ධ්‍යාන ශීලය නම් වූ ප්‍රතිව්‍රතා ධර්මය මෙහිත සියළු

උත්‍රාවක්‍රවට මාලාභරණයෙන් පිළිබිඹු වන ආත්මීය සංවර ගුණාංග

1. වටය (ධ්‍යාණ) මහාවීතරාගිත්වය - කාමය වරදවා නොහැසිරීම
2. වටය (බල) දෙපිවීතරාගිත්වය - සමලිංගික සේවනයෙන් තොර වීම
3. වටය (ගිරි) තුන්පිවීතරාගිත්වය - ස්වයං වින්දන රාග චෑම් ඉවත් කරලීම
4. වටය (පති) ධීරවීතරාගිත්වය - කාම රාග මැඩ පවත්වා ගැනීමේ චිත්ත බලය
5. වටය (ඉන්ද්‍ර) සුචාරිතවීතරාගිත්වය - ශ්‍රේෂ්ඨ බ්‍රහ්මචාරී ශීලය සුරැකීම
6. වටය (රක්ඛ) ශෝභනවීතරාගිත්වය - පස් ඉඳුරන් දමනය කිරීම
7. වටය (ආචිත) පරිශුද්ධවීතරාගිත්වය - පතිව්‍රතා ධර්මය සුරැකීම

මෙම ගුණාංග වර්ධනය කර ගැනීම උදෙසා කාන්තාවන් එහිය අරමුණෙන් ඔස්සේ ගමන් කරවීම උත්‍රාවක්ක්‍රමාලාභරණ ධ්‍යානයයි. උත්‍රාවක්‍රමාලාභරණය සකස් කර ඇත්තේ යශෝධරා දේවියගේ වීතරාගී ගුණයන්ට උපහාර වශයෙනි. එදුමිය පිරිනිවන් පෑමට පෙර ස්වකීය පතිව්‍රතා ධර්මය මෙනෙහි කර ඉර හඳ දුනට ගෙන ප්‍රාතිහාර්යය පාමින් කාන්තා ගුණයේ බලය දර්ශනය කළ බව පැරණි ග්‍රන්ථ වල සඳහන් වේ. පතිව්‍රතා පාරමී නම් පුස්කොළ ග්‍රන්ථයේ ඇයගේ පතිවත ක්‍රියාව සඳහන් වන්නේ මෙසේය. ,එකල්හි බිම්බා මහරහත් මෙහෙණින් වහන්සේ පිරිනිවන් මංචකයට අවසර ගනු පිනිස තිලෝගුරු බුදුරජුන් පා වැද මාගේ පතිව්‍රතා ධර්ම බලය අදිෂ්ඨාන කරමින් කියා කියූ තැන දී ඉර හඳ දෙමඩල ශ්‍රී දෙහස්තයෙන්ම ගෙන අහස පොළොව මැනි කාන්තා ගුගුරා. යන්නට ප්‍රාතිහාර්ය කළ කල්හි. කාන්තාවකගේ ආත්මීය පාරිශුද්ධිය ප්‍රතිව්‍රතා ධර්මය මත පවතින බව මේ කතාවෙන් හෙළි දක්වා ඇත.

ISBN 978-1-78280-808-4
9 781782 808084
ශ්‍රී රාවණා වංශය ග්‍රන්ථ කේන්ද්‍රය

චතුර්ධනාණ පාරමිතා

විවාහක කාන්තාව උත්‍රාවක්‍රවට ශීලය ආරක්ෂා කරන අතර සැමියාට ද එක්තරා ශීල ප්‍රත්පත්තියක පිහිටා කටයුතු කිරීමට අනුබල දී ඇත. එය චතුර්ධ්‍යාන පාරමිතා ශීලය නමින් හඳුන්වනු ලබයි. පවුල් ජීවිතයට හානිවන පරදාර සේවනය හා කාම රාගය මැඩ පවත්වා අඹු සැමියන් අතර ඇති සුහද සබඳතාවය විකෘති නොවන අයුරින් කටයුතු කිරීමට පෙළඹීම මෙම ශීලයෙන් සිදුවේ. මෙයින් ගෘහ ජීවිතයේ උපරිම ශක්තිය ලබා ගැනීමට හැකි වන අතර බුද්ධිමත් නීරෝගී නීතිගරුක දරු පරපුරක් බිහි කිරීමෙහිලා ප්‍රයෝජනවත් වනු ඇත. යක්ෂ ගෝත්‍රිකයන් කාන්තාවකගේ පාරිශුද්ධිය අපේක්ෂා නොකරන අතරම පිරිමියාගේ පාරිශුද්ධිය පිළිබඳව ද වැඩි සැලකිල්ලක් යොමු කරයි. චතුර්ධ්‍යාන ශීලය සංකේතවත් කරන්නේ චතුර්ධ්‍යානාභරණය මගිනි. මෙය පිරිමින් විසින් පලඳිනු ලබන ගිවිසුම් ලිංගාභරණයකි. මෙය වට සතරකින් යුක්තය. එම වටයන් නම් සුබෝද, දැහැන් මෙවුර, පාලාඨ, මානවතයි. මෙම වටයන්ගෙන් සංකේතවත් වන ශීලයන් වන්නේ කුමර බ්‍රහ්මචාරිත්වය, කාමයෙහි වරදවා නොහැසිරීම, සිවී පෝදා බඹසර රැකීම, සුදුසු කළ ගිහිගෙයින් නික්මීම (යෝගී ජීවිතයට පිවිසීම). අන්තඃපුර ක්‍රමය අනුගමනය කිරීමට මෙම ශීල නීතියට අනුව අවසරය ඇතත් අන්සතු බිරිඳක් පාවා ගැනීම ශීලය කෙලෙසා ගැනීමකි. රාවණා රජ චතුර්ධ්‍යානාභරණය පැළඳ සිටි බැවින් සීතා දේවිය සිය මෙහෙසිය කර ගැනීමට ප්‍රයත්ත දරා නැතැයි ඉරුගල් බංඩාර යක්ෂ ගෝත්‍රික ග්‍රන්ථ හා විනය ග්‍රන්ථ එකහෙලා ප්‍රකාශ කරයි. පතිවෘතා ශීලයෙත් සහ නෙක්ඛම්ම පාරමී ශීලයෙත් අඹු සැමියන් වීතරාගී පුද්ගලයන් බවට පත් කරනවාට වඩා නීරෝගී මනසකින් කම් සැපතෙහි උපරිම ඵලය ගෙන ඒමට පුද්ගලයන් එකම අරමුනක පිහිටා කටයුතු යොදවනු ලැබේ. වරිගපුරණිකාවේ සඳහන් කරන අන්දමට කම රාගය නදියකි. එහි සැඩ රළ හා පත්ලෙහි බියකරු ශිඛර ඛණ්ඩයන් ඇති බව දැක වීතරාගී ඔරුවෙන් පතිවෘතා හබල ගෙන එය තරනය කරන්නන් සසර දුක් නැසීමේ භාග්‍යවන්තයෝ වන්නෝය. උත්‍රාවක්‍රවට ශීලයට අනුව චතුර්ධ්‍යාණාභරණ පැලඳූ සැමියා දෙවියෙක් සේ සැලකිය යුතුය. ඔහුගේ බිරිඳ විටක මාතාව වන්නීය. නැවත සොයුරිය වන්නීය. යළිදු කුළුපග යෙහෙළිය වන්නීය. සයනයේදී පමනත් පතිනිය වන්නීය.

පයෝදරාභරණය

ස්ත්‍රීන්ගේ පයෝදර ආවරණය කිරීම සඳහා රන්රිදී මුතු ආදියෙන් නිමකර ඇති මෙය කලාත්මක ආභරණයකි විවාහක පුරුෂයා හැරෙන්නට මේ ආභරණය අන් අයගේ දර්ශනයට පත් නොකරයි. මෙය යක්ෂ ගෝත්‍රික කාන්තාවන්ගේ චාරිත්‍රයකි. ස්නානය අවස්ථාවලදී පවා මෙය සඟවා ගත යුතු පිරිසිදු ආභරණයකි. මෙය මව් කිරෙන් සෝදා ගෞරව දැක්වීම කිරි මව්වරුන්ගේ සිරිතයි

ඔටුන්න

රජ පරපුරකින් පැවත එන රවිශෛලාශ වංශික කාන්තාවෝ විවාහ අවස්ථාවලදී මේ ඔටුන්න පළඳිති. සිරි රත්නපාලි කුමරියට ගෞරව දැකීම සඳහා මේ වංශයේ කාන්තාවෝ විවාහයේදී මෙය පළඳින බව මකයකව පවතී. රන් රිදී මුතු

ISBN 978-1-78280-808-4

ආදියෙන් ඇතැම් අය මෙය නිම කරති. වත්කම් අනුව අවශ්‍ය ලෝහ වර්ණයකින් මෙය සාදා ගත හැකිය.

කනත ගවඩිය

රවියෙශලාශ කාන්තාවෝ ඉන පළඳින ආභරණයක් බව සැලකේ. එම වංශික කාන්තාවෝ මල් වරවූ දිනයේ සිට පළඳින මේ ආභරණය විවාහයෙන් පසු අනාගත යහන මතදී ඉවත් කරනු ලැබේ. අවිවාහක කාන්තාවෝ විවාහාත්තය දක්වා පැළඳී මෙයින් අදහස් කරන්නේ කුමරි බඹසර ශීලයයි.

නාසාභරණය

රන් රිදීයෙන් නිම කරණ ලද මේ ආභරණය ද්‍රවිඩ කාන්තාවන් මෙන් නාසය විද පළඳින ආභරණයක් නොවේ. කිසියම් උපකරණයක් මගින් නාසයේ රඳවා තබා ගැනීමට හැකි වනසේ සකස් කර ඇති මේ ආභරණය දිව්‍යාභරණයක් ලෙස සලකනු ලැබේ. දේව පූජා උත්සව වලදී කාන්තාවෝ මෙය පළඳති.

කර්ණපටාභරණය

මෙය පැළඳීමෙන් තන පට අලංකාර අන්දමින් ආවරණය වෙයි. රන් මුතු ආදියෙන් තනා විවිධ කලාසම්ප්‍රදායන්ට අනුව මෙය සාදා ගනු ලැබේ

හත්පොටමාලය

යක්ෂ වංශයට අයත් ආභරණයෙකි. මහාපාලිය නොහොත් කුලවිනියට ගෞරව පිණිස පළඳින ආභරණයකි. මෙය වංශයේ සංකේතයක් වශයෙන් ද සලකනු ලැබේ. සත්පොට මාලය බොහෝ කොට පළඳිනු ලබනුයේ කුමරි අවස්ථාවේදීය. උත්‍රාවක්‍රමාලාභරණ ගෙලෙන් ඉවත් කිරීම නුසුදුසු බැවින් විවාහක කාන්තාවන් මෙය ගෙල පැළඳීමක් සිදු නොකරයි.

මධු සමය තෙක් විවාහ ජීවිතයේ දී අනුගමනය කරන සිරිත් විරිත්

විවාහක අඹුසැමි යුවලගේ අසිරිමත් අවස්ථාව වන්නේ මධුසමය ගත කරන කාලයයි. ඒ වෙනුවෙන් සැකසී ඇති චාරිත්‍ර විධි රැසක් යක්ෂ ගෝත්‍රික කාන්තාවන් අත දැක ගත හැකිය. මේවා බෞද්ධ ප්‍රතිපත්තියට අනුව ගොඩ නැගී ඇත. මේ චාරිත් පිළිවෙලින් උත්තරීතර සාරධර්ම රැසක් ආරක්ෂා කරයි. කම් සුවයේ ලිංගිකත්වය උදා සැපතක් ලෙස සලකනු ලැබුවත් එහි ඉවසීම හා පාලනයක් ඇති කරගන්නේ කෙසේ යන්න විමසීමට ලක් කිරීමක් දක්නට නොලැබේ. එහෙත් යක්ෂ ගෝත්‍රික කාන්තාවන්ට පුරුෂයින්ට විවාහ ජීවිතයේ එම අසිරිමත් අවස්ථාවට මුහුණු දෙන ආකාරය ගැන පූර් ඇනුමක් ලබාදෙයි. කාම රාගයේ අනිසි ඵල භුක්ති විඳින අඹු සැමියන්ට හා තරු තරුණියන්ට මෙයින් උගත හැකි පාඩම් රැසකි. පහත් කාම ආශාවන්ගේ තෘප්ති උදෙසා පීඩනයට ලක් වූ හා ජීවිත හානියට පත් කාන්තාවන් ගැන අද අසන්නට ලැබේ

ISBN 978-1-78280-808-4

විවාහ යෝජනාව

විවාහ යෝජනා ගෙන එමේදී වරප්‍රසාද ලත් දෙදෙනෙකු ලෙස පිළිගන්නේ ඇවියන සැන්දනීය හා ඉද්ගත්තකන්ධරාල (මඟුල් කපුවා) යන දෙදෙනාය. ඉද්ගත්තකන්ධරාල කපුකමෙහි නිරත වූයේ වෘත්තියක් හැටියටයි. කපු මහතා විවාහ යෝජනා ගෙන එනු ලබන්නේ සංදේශයක් මඟිනි. එකල එය පිළිගත් ක්‍රමයකි. සංදේශයෙහි කුමරාගේ හෝ කුමරිය පිළිබඳ අදාල තොරතුරු අන්තර්ගතය. මෙහිදී මෙය පලමු කොට පිරිත් නූලෙන් ආශිර්වාද කර ඉතාමත් ගෞරවයෙන් ගෙන යනු ලබනනකි. දෙපාර්ශවයේම පොදු එකඟතාවයකින් අනතුරුව කුමරා තම කැමැත්ත ප්‍රකාශ කරනනේ කුමරිය ගෙල පැල්ලක් පැලඳීමෙනි. යෝජිත විවාහ ක්‍රමයට අමතරව ම තමාටම සහකරුවෙකු හෝ සහකාරියක තෝරා ගැනීමේ නිදහස ඇත.

යසස්ථ මංගල පෝරුව

කුමර කුමරියගෙ බ්‍රහ්මචාරී ශීලයට උපහාර වශයෙන් යසස්ථ මංගල පෝරු සංකල්පය බිහි වී ඇත. විවාහය යනු ගෘහ ජීවිතයේ සුවිශේෂ වූ අවස්ථාවක් වන බැවින් එහි ගෞරවය රැක ගැනීම මේ තුලින් සිදු වේ. මංගල පෝරුව සකස් කිරීමේදී කලා සම්ප්‍රදායනට හා චාරිත්‍රවලට මුල් තැන ලැබේ. පෝරුව ඉදිරිපස ඉර හඳ සංකේතවත් කරනනෙ යශෝධරා දේවියගෙ පතිවෘත්තා ධර්මයට උපහාර වශයෙනි. කුමර බඹසර නොරැකි පිරිමින් මෙම පෝරු මස්තකයේදී දේව ශාපයන්ට ලක්වන බව යක්ෂ ගෝත්‍රික සර්ව සාධාරන මානව විනය ග්‍රන්ථයක සඳහන් වේ

බඹසර යහන

විවාහ වූ දෙපලට පලමු රාත්‍රිය ගත කිරීම සඳහා සකස් කරන ලද යහන බඹසර යහනයි. පලමු රාත්‍රියේ බඹසර යහන මත අඹුසැමි යුවල තව දුරටත් මෙහිදී බ්‍රහ්මචර්යාව සුරැකිය යුතුය. කාමතාව යනු රාගයේ ප්‍රතිමූර්තියක් නොව උත්තම සැනැසීමක බව හැඟවීමට මේ චාරිත්‍රය ඉටු කරනු ලබයි. බඹසර යහන තුලින කාමිරාගයේ චිත්ත ධාරාවනහි සමබරතාවය පවත්වා ගැනීමට භාවනාමය චිත්ත සමාධිය වෙත සිත යොමු කිරීම සිදුවේ. ලිංගිකත්වයේදී විකෘති උද්දීපනවලින් තොරව පවුල සංස්ථාව තුළ සාර්ථක පවුල් දිවියකට ඉවහල් වන මනෝ බන්ධනයක් ඇති කරවීම මේ පිළිවෙතින සිදු වේ. මේ සඳහාම විශේෂයෙන වෙන්කර තබන කාමරයක් පිරිසිදු කොට ආසනය සකස් කොට එය මත රටා සම්ප්‍රදායනට අනුව වියාගෙන පැදුරක් එලයි. එයට සඳුන් දිය ඉස යකිනාරන ගසේ මල් කොල පොතු ආදියද දමයි. සුදු පිරුවට සිදුවිරන පස පිඹුම් පසළො ආදියෙන ආසනය වට කරයි. ආසනය වටා පහන් දැල්වීමද සිරිතකි. යහන ඉස මත මල් බුලත් තට්ටුවක් තබා එහි පිරිත් පොත් විශ්වාස පැවැත්ම කරයි. බඹසර යහන සකස් කරන අයුරින්ම පෙනී යන්නේ කුමර කුමරි බ්‍රහ්මචර්යාවට කොතරම් උපහාර දක්වා ඇද්ද යන්නයි. බඹසර යහන සංකල්පනාව [illegible] වන විශේෂ කරුනු කීපයක් පහතවුරා වේ

1 විකෘති ලිංගිකත්වයෙන් බැහැර වීම
2 ආදරය සහ ලිංගික ආකර්ෂණය සමබරතාවයෙන් පවත්වා ගැනීම
3 සදාචාර ආරක්ෂා කර ගැනීම

රාවණ වංශ පුස්තක
සංරක්ෂණාගාරය
සතුය

ISBN 978-1-78280-808-4

4. නෙක්ඛම්ම පාරමිතාව අර්ථ ලෙස ප්‍රගුණ කිරීම
5. ගිහි ජීවිත ගුරුකම

අතග යහන

මධු සමය ගත කිරීම සඳහා යොදා ගන්නා මංගල යහන මේ නමින් ව්‍යවහාර කරයි. යුග දිවියකදී සත්‍යයේ, පවිත්‍රත්වයේ, සාධාරණත්වයේ කේන්ද්‍රස්ථානය ලෙසින් පිළි ගන්නා අතග යහන ශුද්ධ වස්තුවකි. අතග යහනෙහි ඇතිරීම සඳහාද විශේෂ කලාලයක් සකස් කර ගනී. ආවේණික රටා සම්ප්‍රදායන්ට අනුව ඇස්පත්, මහලුකු දඟය හීන් ලනු අගය, ආවීරි ගයන්කාරය, කිඹිසිරි රටා, සත්තෝ ප්‍රධාන රටා, පබ්බඩාවී රටා, මුනමුර රටා, කෝසිකාවම්ග රටා, යොදා සකස් කෙරෙන පැදුරක් යහනේ එළීම සඳහා භාවිතා කරයි. කලාල වියීම සඳහා යොදා ගනු ලබන්නේ බොරු පන් නම් ඉතා මුදු පන් විශේෂයකි. කුමරියගේ කුමරි බඹසර පසක් කරවන ධවල පිරුවටය යහන මත එළා හීන් කෙන්ද මල් ඒ මතට ඉසුනු ලබයි. අතග යහනට සැපත් වන යුවතිපතීන් පිරිත් පැන් හඳුන් මිශ්‍ර ජලයෙන් පිරිසිදු වී පියවර සතක් යන ගමන ශුද්ධ කාය කුලයට අයත් කාන්තාවක් විසින් සිදු කරයි.

ධවල චන්දන පිරිත් පැන් අතලය

මෙය සකස් කිරීමේදී ග්‍රාමයේ වෙද මහතා විසින් අවශ්‍ය භූමිය ගැඹු මෙනෙහි කොට වලක් සකසා ඉන් පිරිසිදු උල්පත් ජලය ලබා ගනී. මෙය ප්‍රසුවිල නමින් ද හඳුන්වනු ලැබේ. මෙයට එකතු වූ උල්පත් ජලය නියමිත ප්‍රමාණයේ කළයකට ගෙන සුදු හඳුන් මිශ්‍ර කර භික්ෂූන් වහන්සේ ලවා පිරිත් කර ආශිර්වාද කරවනු ලැබේ. එම ජලය ගෙන යුවතිපතීන් ස්නානය කිරීම තවත් එක චාරිත්‍රයකි. කුවේණියට පතිව්‍රතා ධර්මයට උපහාර දැක්වූ යක්ෂ ගෝත්‍රිකයෝ ඇයට ගෞරව කිරීමක් හැටියට එතුමිය පරපුරේ මෙහෙනිය ලෙස නම් කළහ. සිරිරවි ගෞරවාකාරත්වයට හිතනුකිය කළ ප්‍රතිහරග රජෙල් මාතා තෙරී මෑව. උත්‍රාවක්‍රමාලා ක්‍රමයෙන පියැවෙන ශීලයෙන් ආධ්‍යාත්තරික වශයෙන් චිත්ත පාරිශුද්ධත්වයට පත් කාන්තාව සැබැවින්ම ආදර්ශමත් මාතාවක වූවාය. ලෝකයේ මුල සිටම කාන්තා නායිකාවන විසුවේ ශ්‍රී ලංකාවේ ය කච්ලාශපාලි බිසව, මහාපාලි හෙවත් කුවේණිය, ශ්‍රී රතනපාලි බිසව කාන්තාවන අත ශ්‍රේෂ්ඨත්වයට පත්වූහ. මහානාම රජු සමයේ ලංවදුන් නීලවේලද්දු නම් ද්‍රවිඩ නායකයා රත්න පාලිබිසවට කළ අයුතු යෝජනාව ප්‍රතික්ෂේප කොට ඔහු සමඟ යුද වැදුනේ පතිව්‍රතා ධර්මයට ගරු කිරීමක හැටියටයි. ලිංගික ක්‍රියාවලිය අතිශය පාරිශුද්ධ දෙයක් ලෙස සලකනු ලැබේ. මෙහිදී මූලික විනය ලෙස සඳහන් දිය. රත්තරන් ස්නානය කොට පිරිසුදු භාවයට පත්වීම අනිවාර්ය අංගයකි. ශරීරගත කිලි කෙමෙ විෂබීජ තුරන් කිරීමෙන් දෙදෙනාගෙම නීරෝගීභාවය එයින් සැලසෙනවා මෙන්ම නිතර භාවිතයට ගෙන ඇති ඖෂධයකි. මෙවැනි ඖෂධ භාවිතයෙන් කායික මෙන් මානසික වර්ධනයක් ඇති කරයි. එමෙන්ම ලිංගික ක්‍රියාවලිය සඳහා දෙදෙනාම ප්‍ර ස්නානයකින් හා තෘප්තියකින් පසුවීම හේතු කරගෙන පවුල සංස්ථාව තුළ බිඳ වැටීම් ද ඇති නොකරයි. නිරෝගී දරු සම්පත බිහි කිරීමෙහි ලා මෙය ඉවහල් වන බව සැලකිය යුතුය. ශරීර සෞඛ්‍ය පිළිබඳව සැලකිලිමත් වන ඔවුන් අනුගමනය කළ තව චාරිත්‍රයක් නම් විවාහකයන් හා අවිවාහකයන් අතර ඇඳුම් පැළඳුම් හුවමාරු

ISBN 978-1-78280-808-4

[illegible]

[illegible]

[illegible]

1. [illegible]
2. [illegible]
3. [illegible]
4. [illegible]
5. [illegible]
6. [illegible]
7. [illegible]
8. [illegible]

[illegible]

[illegible]

ISBN 978-1-78280-808-4

ඔවුන් භාවිතා කල [illegible] වෙනස්ය. [illegible] ගොත්‍රිකයන් [illegible] 30 ක් පමණ [illegible] ඔවුන් අතර [illegible] ගොත්‍රිකයන්ට [illegible] ගොත්‍රිකයන් [illegible] ඔවුන් [illegible] ගොත්‍රික [illegible] ඔවුන්ගේ [illegible] ගොත්‍රික [illegible] ආභරණ විශේෂයක් පැලඳෙ

1 [illegible] — [illegible]

2 [illegible] — [illegible] භාවිතයි

3 [illegible] — [illegible] ආභරණය සඳහා [illegible]

4 [illegible] — [illegible] ආභරණය කරන [illegible] භාවිතා කරයි

5 [illegible] — [illegible] අවස්ථාවලදී මෙය භාවිතා කරයි

6 [illegible] — [illegible] මංගල [illegible]

ISBN 978-1-78280-808-4

	භාවිතා කෙරේ. සගල් ජෝතිය භාවිතා කරන්නේ සාමාන්‍ය අවස්ථාවලදීය. මේවා විවාහක පුරුෂයින්ගේ වස්ත්‍රයි. වන්නි ජෝතිය අවිවාහක කුමරුන්ගේ වස්ත්‍රයකි. වටිනා වස්ත්‍රවලින් හා සාම්ප්‍රදායික විලාසිතා අංග වලින් සමන්විත වෙයි.
7. හිබරය	උඩුකය ආවරණය වන වස්ත්‍රයකි. මංගල අවස්ථාවලදී විචිත්‍ර සළුවලින් ද සාමාන්‍ය අවස්ථාවලදී තනි පාට සළුවලින්ද මෙය නිම කෙරේ. මෙය කන්ද උඩරට රාජධානි සමයේ මෙ අය හැඳීමට හුරු පුරුදු වු උඩරට සාම්ප්‍රදායික ඇඳුමකි.
8. පේරස් මුදුව	මංගල ආභරණයකි. රන් මිණි ආදියෙන් නිමකරන ලද්දකි. අතැඟිලි පළඳිති.
9. ලය තැල්ම	ලය ප්‍රදේශය ආවරණය වන අයුරින් පළඳින ආභරණයකි.
10. මේඛල තැල්ල	රන් මිනි මුතු අදියෙන් නිම කර ඇති ආභරණයකි.
11. තලේ ඕවුන්ත	මංගල අවස්ථාවේදී පලඳින ආභරණයකි.
12. තෝර ඇට හවඩිය (කොංවරිය)	අවිවාහක පිරිමින් ඉන පලඳින ආභරණයකි. රන්මිණි මුතු වලින් නිම කෙරේ.
13. බද බන්ධනය	බද ප්‍රදේශයේ පළඳින ආභරණයකි. අසිපත රඳවා තබන්නේ මෙහිය. අංගපුර සටන් වලදී මෙය පළඳිනු ලැබේ.
14. බාහු වළල්ල	අතේ බාහුවට පලඳිනු ලබයි. වටිනා ලෝහයන්ගෙන් නිෂ්පාදිත මෙය අවිවාහක කුමරාවරුන් පලඳිති.
15. තට තගිලා හවඩිය	විවාහකයන් පලඳිනු ලබන හවඩියකි. මෙය ද වත්කම් අනුව විවිධ ලෝහ වලින් සාදා ගනු ලබයි.

රාවණ වංශ පුස්තක සංරක්ෂණාගාර සතුය

ISBN 978-1-78280-808-4

ගෘහ උපකරණ

මුල් අවදියේ ඔවුන් භාවිතා කළ ගෘහ උපකරණ පිළිබඳව සඳහන් නොවෙතත් සු කලෙක ඔවුන් භාවිතා කළ ගෘහ උපකරණ කීපයක් නිවෙස් වල තිබුනි.

ැතපෙන යහන	මෙය උඩු වියන් බැඳි යහනකි. සිව්ගඩිය ගෘහ කැටයම් මෙයට යොදා ඇත.
බෙහෙත් සැරයටිය	වෙද වෘත්තිකයන් මෙය භාවිතා කර ඇත. ඔසු තැන්පත් කිරීම සඳහා එකිනෙකට සම්බන්ධ කළ කුටීර සතකින් යුක්ත මෙය සම්ප්‍රදායික ලී කැටයම් වලින් නිම කරයි.
ාගාසනය	ප්‍රධාන පෙලේ අමුත්තන් සඳහා වෙන්වුන ආසනයකි. මෙය තබන්නේ විහාරස්ථාන වල හා ගෝත්‍රික නායකයාගේ නිවසේ පමණි.
දෝලා පල්ලැක්කිය	ඉරුගල් බණ්ඩාර රාජකරුණා වංශිකයන් ගමන් බිමන් යෑම සඳහා යොදා ගෙන ඇත. මේවා ඔසවා ගෙන යෑමට මෙහෙකාර සේවා ලබා ගනී.
උඩ හැල්ල	මුලුතැන් තබන ලද උපකරණයෙකි. පන් වලින් හා ලී වලින් නිම කරනු ලැබේ කලාත්මක වූ මෙම උපකරණය පිඟන් අසුරා තැබීමට භාවිතා කෙරේ.
නාග පහන	නිවෙස් වල දල්වන මෙය නාග ආකෘතියක් ඇති පිත්තල පහණකි. ඉරුගල් යක්ෂ ගෝත්‍රික නිවෙස්වල මෙය තිබී ඇත.
මුකරවය	පිත්තලෙන් නිම කල කලාත්මක භාණ්ඩයකි. ආහාර පිරිනැමීමේදී මෙය මත තබා පිළිගැන්වීම සිරිතකි.
කෙන්ඩිය හා සෙම්බුව	ආගමික කටයුතු වලදී කෙන්ඩියද, දෛනික කටුතු වලදී සෙම්බුවද ජල බඳුනක් වශයෙන් භාවිතා කර ඇත.
අංජන ඝටය	මුලු තැන් ගෙහි තබන ජල බඳුනකි. මැටි වලින් නිම කර ඇත. නැවුම් ජලය සාදා ගැනීමට මෙය භාවිතා කෙරේ.
සොතනිය	මෙය සර්ව මිනුම් උපකරණයකි. මෙහි දියර වර්ග මැනීම සඳහාද බර කිරීම සඳහාද, ධාන්‍ය වර්ග මැනීම සඳහාද, සවිකළ කොටස් ඇත

රාවණ වංශ්‍ය පුස්තක සංරක්ෂණාගාරය සතුය

ISBN 978-1-78280-808-4

ඔලිඳ කොළම්බුව — ආගමික ක්‍රීඩා උපකරණයකි. ලී යෙන් කැටයම් යොදා නිම කර ඇත. පත්තිනි දෙවියන්ට උපහාර වශයෙන් මෙය භාවිතා කෙරේ.

ආහාර වර්ග

පුරාණයේ යක්ෂ ගෝත්‍රිකයන් ධාන්‍ය වර්ග වලට අමතරව අල වර්ග සහ මස් මාංශ වර්ග හා එළවළු ද ආහාරය සඳහා පිළියෙල කරගෙන ඇත. ආගමික ජිවිතය හා කැප වු යක්ෂ ගෝත්‍රික ඍෂිවරුන් මස් මාංශ අනුභව නොකලත් අනිකුත් අය මාංශ අනුභවයද කරන්නට ඇත. බෞද්ධ ප්‍රතිපත්ති මත කටයුතු කළ අය නිසා හිංසාවාදී ක්‍රියා වලින් වෙන් වුහ. ඔවුන් පිළියෙල කරගත් ව්‍යංජන විශේෂ කීපයක් පිළිබඳ වරිග පුර්ණිකාවෙහිද සඳහන් වෙයි. ව්‍යංජන සකස් කර ගැනිමේදී මස් මාංශ අල ධාන්‍ය වර්ග ප්‍රයෝජනයට ගෙන ඇත.

"නීලගිරි උදාරය කෙවෙනි පුපල කිරාවැ ඇති කලැ පුපල බෝජය"

කරණයේ නියඹිල මා පිණිස සේ කරාවී යක් මහිලාවෝ
ඉහෙන පංච කල්‍යාණ නාරිවැ මනා සිහි කොටස ද වැ
පුරුෂයෝ හෝජයර රක්ඛ පයසමාව යහතියැ
සම්පතිය බල තේජස මැ ආඩිසයැ
ඊ පානීපා මෙසේ පත්තිරු කරම්හ..

මෙයින් පෙනෙන්නේ සමතුලිත ආහාර වේලක් ගැනීමට යක්ෂ ගෝත්‍රිකයෝ සැලකිලිමත් වු බවයි. වා පිත සෙම් වලට ගුණදායිවු ආහාර වේලක් සකස් කර ගැනීම පිළිබඳව දැනුමක් ඔවුනට තිබුණි. නීලගිරි යක්ෂ මහිලාවෝ මස් මංශ එලවළු හතු වර්ග නියඹලාවක් සේ සකස් කරගෙන ඇත. එයින් ඔවුනට.

1. ඉහෙන් පංච කල්‍යාන නාරිවැ - කාන්තාවනට පංච කල්‍යාණයෙන් යුතු රූප ස්වභාවයක් ලැබේ.
2. මනා සිහි කොටස ද වැ - මනා සිහියෙන යුතු වේ.
3. පුරුෂයෝ හෝජයැ - පුරුෂයෝ වීර්යයෙන් ශක්තියෙන් ප්‍රඥාවෙන් දියුණු වේ.
4. රක්ඛපය සමාව යහතියැ - වාපිත් සෙම් සමනය කරයි.
5. සම්පතිය බල තේජස යැ - ප්‍රතිශක්තිය ඇති කරයි.

ආහාර වේලක් සකස් කර ගැනීමේදී එහි ගුණානුභාවය පිළිබඳව විමසිලිමත් විය. ඔවුන් මස් මාංශ එළවළු පලා වර්ග හා ධාන්‍ය වර්ග යොදාගෙන රසවත් ආහාර වේලක් සකස් කරගෙන ඇත. එවැනි ව්‍යංජන වර්ග කීපයක් ගැන මෙසේ සඳහන වේ.

හේර නියඹිල විය - (පොල් අඹරා දමා සාදා ගත්තකි.)
හේර අඹු[illegible] විය
හේර කෙවෙස විය - (කිරට)
හේර ආනම විය - (පිටි මිශ්‍රකර උදු ව්‍යංජනයකට සමානය)

ISBN 978-1-78280-808-4

ගේර බදුර විය - (බැදුම)
ගේර පංජ විය - (කල් පවතින ආහාරයක්)
ගේර කුසීල විය - (ඇඹුල් තියල්)
ගේර අද්දක විය
ගේර සකුජ විය - (ලුහු අය සඳහා ආහාරයකි)
~~ගේර~~ සරිගාව විය
~~ගේර~~ ඝත්රව විය - (ගොද්ද)
ගේර ජප්පල විය - (වැවී මාලු)
ගේර මද්දන විය
ගේර පායාස විය
ගේර ගුලුපාත්හ විය
ගේර ආරජ විය

රාවණ වංශ්‍ය පුස්තක සංරක්ෂණාගාරය සතුය

වැංජන වර්ග

කැකිරි කටුපුහුල් අඹ වැනි වැනි දේවලින් ඇඹුල සාදා ගනී. පුරාණයේ සිටම ආහාර අනුභවයට ඇඹුල ක්‍රමය යොදා ගෙන ඇත. පලා වර්ග, කෙකටිය වැල්අල මල් ආදියෙන් තියඹිලාවක් සාදා ගනියි. ආතම් යනුවෙන් අදහස් කරන්නේ පිටි වලින් වලින සාදා ගන්නා වැංජන විශේෂයකි. කෝන් අනුග හා පැහිරි බොවුර වැනි ඇඹුල් වර්ග කල්තබා ගැනීමේ ක්‍රම ඔවුන් අතර පැවතුනි.

රාවණ වංශ්‍ය පුස්තක සංරක්ෂණාගාරය සතුය

නාමිකව පවතින මේ ආහාර වර්ග කෙබුඳු ආකාරයකින් සකස කර ගත්තද යන්න නිශ්චිතව කිව නොහැකිය. එහෙත් මෑත භාගයේ පැරණි ගම් වල අනුභවයට ගෙන ඇති ආහාර වට්ටෝරු දෙස බලන විට ඒවා පුරාණයේ ආහාර වට්ටෝරුවකින් සකස් කරගත් ඒවා ලෙස පෙනී යයි.

දුන්තෙල් මිශ්‍ර බත, සුවදැල් බත, රත්හැල් බත, කිතිහිරි බත ඕසු බත, මිශ්‍ර බත් යන බත් වර්ග ආහාරයට ගෙන ඇත. මෙයින් කිතිහිරි බත කිනම් හාල් වර්ගයන් යොදා සාදා ගත්තද යන්න ගමේ පැරණි අයද නොදන්නා කරුණකි. බෙහෙත් වර්ග මිශ්‍ර කරගෙන කිරි බතකට සමානව පිස ගන්නා බත ඕසු බත වශයෙන් හඳුන්වයි. මේ බත බුද්ධ කාලයේ ඉන්දියාවේ ද භාවිතා කර ඇත. උදරාබාධා වලට මේ බෙහෙත් කිරිබත යක්ෂ ගෝත්‍රිකයෝ අනුභව කළහ. මෙයට අමතරව මෙනේරි, කොල්ලු, මුං ඇට, ලබු, තණහාල්, පස්ගෝ රස, හුමැ, කෙදෙල, ගෝදල, කාගල්ල ආදී ධාන්‍ය වර්ගආහාරයට ගත් බව සඳහන් වේ.

රාවණ වංශ්‍ය පුස්තක සංරක්ෂණාගාරය සතුය

පිට්ටු සහ හැලප

උදේ ආහාර වේල සම්පාදනය කර ගන්නේ වැඩි වශයෙන්ම පිට්ටු හැලපයයි. කුරක්කන් හාල්, තෙල් කිතුල් වැනි දේ වලින් පිට්ටු වර්ග සාදා ගනී.

කරැක්කල්

ඌරු මස් වලින් සකස් කර ගනියි.

ISBN 978-1-78280-808-4

පලාහරිය	තිඹබටු පලා වර්ග උඩුත්තාදළු, ලී කොළ, පුහුඹලිය කොළ ආදියෙන් සාදා ගනී.

කිරි, දිකිරි, වෙඬරු, ක්ෂිරමොපු ආදියද මෙම ගෝත්‍රිකයන්ගේ ආහාර විය.

කැවිලි වර්ග

කැවුම් මී පැණි, බඹර පැණි, දෙබර පැණි, පොල් පැණි, කිතුල් පැණි ආදිය යොදාගෙන මේ කැවුම් වර්ග සාදාගෙන ඇත. මුං, තල වැනි ධාන්‍ය වර්ගද කැවුම් සාදා ගැනීමට යොදාගනී. උදු වලලු සහ *කොමලවටා* විශේෂ කැවිලි වර්ගයකි.

කොමොල වටා පෙම්වතුන් සඳහා පිරිනමන විශේෂ කැවිලි වර්ගයකි. *තරුපති* (ආස්මි) වැලි පිට්ටු, ගොටු පිට්ටු ආදියද ආහාරයට ගෙනඇත. ගැබිනි මව්වරු සඳහාද විශේෂ කැවිලි වර්ග *වෙල්ලහැවුම්, කිරිවැදිනිය, කිරිරොටි*, අදියයි. කිරිවැදැනිය යනු කිරිරොටි වලට සමානව සාදා ගන්නා ආහාර වේලකි.

ගොවිතැන් වලදී අත්තමට පැමිණෙන අයට සහ උත්සව කටයුතු වලදී ද වෙනත් ආහාර වර්ග වලට අමතරව කිරි පැනි සාදා ගනී. මෙය හාල්පිටි පැනි මිශ්‍ර කර සාදා ගන්නා ආහාරයකි.

ආහාරය සඳහා අතුරුපස වශයෙන් කැවිලි වලට අමතරව පළතුරු වර්ගද කිරි වර්ගද සහ හකුරු වර්ගද ලබාගෙන ඇත. හකුරු වර්ග අතර මී ලබු හකුරු වලට ඔවුන් වඩාත් කැමැත්තක් දක්වයි. මීලබු සාදා ගන්නේ ලබු කටුවක මී පැනි දමා ගස් බෙනයක තැන්පත් කර මැටි ගසා කලක් තැබීමෙනි. එයින් ඝණ වූ පැණි වලින් හකුරු සෑදේ.

ඖෂධීය බුලත් විට වර්ගද සාදා ගෙන ඇත. බුලත් පුවක් වලට අමතරව කැලේ ඇති මල් කොළ පොතු ආදායද රැගෙන බුලත් විට සකස්කර ඇත. ඖෂධීය දුම් වැටි වග් ද කිතුල් රා තෙලිජය වැනි පානයද ලබාගෙන තිබේ.

ඇඳහිලි හා විශ්වාස

බුදු දහමෙන් දේව ඇදහිල්ල ප්‍රතික්ෂේප වුයේ අන්ධභක්තියෙන් යුතුව හිංසාකාරී ලෙස දෙවියන් පිදීම නිසයි. මිනිසා මෙන්ම ජීවත් වීමේ අයිතියක් ඇති සතුන් ඝාතනය කොට බිලි පුජා පැවැත්වීම නුවණැති පුද්ගලයෙකුගේ ලක්ෂණය නොවේ. අවිහිංසාවාදී ලෙස කරනු ලැබූ ගැමි පුද සිරිත් බොහෝ විට අවඥාවට ලක් වුයේ නැත. එහෙත් මධ්‍යම ප්‍රතිපදාව මත සර්ධාවෙන් හා ප්‍රඥාවෙන් ගොඩ නගා ගත් ආත්ම විශ්වාසය කෙරෙහි බුදු දහම දැඩි ලෙසම අවධාරණයට ලක් කරයි. බුදු දහමට අනුව ප්‍රඥාවෙන් ලොව බලන තැනැත්තා භක්තියෙන් හා තණ්හාවෙන් අල්ලා ගත් සියල්ල ඉබේම අතහැර දමනු ලබයි. ත්‍රිපිටකයේ එන සූත්‍ර වලින් පෙනෙන්නේ බෞද්ධයා දේව විශ්වාස බැහැර කිරීමට දුෂ්කර වූ බවකි. අමනුෂ්‍යයන් උරනු වූ විට ශාපය ලැබීමද ඔවුනට මෙත් වැඩීමේදී උපකාර පවා ලබාගත හැකි බව කරණීයමෙත්ත සූත්‍රයෙන් පෙන්වා දෙයි. ආටානාටිය වැනි සූත්‍ර දේශනා වලින්ද පෙනෙන්නේ දේව විශ්වාස බුදු දහම තුලද මුල් බැසගෙන ඇති බවයි. පසු කාලීන හින්දු බලපෑම හේතු කරගෙන යක්ෂ ගෝත්‍රිකයන් අතරද දේව පුද සිරිත් පැවතුනි. වංශයට අයත් ඇරුනුකොට වෙනත් දෙවිවරුන් උදෙසාද පුද පුජා පවත්වා ඇත. වත්මන් ගැමියන් අතර දක්නට ලැබෙන දේව පුද පුජාවන් කීපයක් මෙහි අන්තර්ගත කරමි.

ISBN 978-1-78280-808-4

මහාදාන මංගල්‍යය

රජරටට අධිපති යැයි සැලකෙන අයියනායක බණ්ඩාර දෙවියන් උදෙසා පවත්වනු ලබන පූජාවකි. ගොවිතැන්හි අස්වනු ලබා මුල් කොටස පිරි සමගින් දෙවියන් උදෙසාය. මේ දේව මංගල්‍යට සූදානම් වීම පේ වීම නමින් හැඳින්වේ. මේ සඳහා පේවා මඩුල්ලක් සකස් කර ඇත.

මෙහිදී කෝල් මුර ගී ගායනා කර උඩැක්කි බෙර වයමින් දේව ගුණ සමරනු ලබන්නේ ප්‍රවේණියේ සෞන්දර්ය කුසලතා විද්‍යා දක්වමිනි. පසු කාලීන ආර්යන් ලෙද්ව පැමිණීමත් හින්දු දේව බලපෑමත් මත යක්ෂ ගෝත්‍රිකයන් අතරද මේ සිරිත් විරිත් ජනප්‍රිය වී ඇත. දේව පූජා ඔප්පු කර කැවුම් කිරිබත් කෙසෙල් ආදියද බත් මුංඇට වට්ටක්කා අමුනුකොල මැල්ලුම සහ සීරපැති ආදිය ආහාර ද්‍රව්‍යද ජනතාවට පිරිනමා දෙවියන්ට පිං පමුනුවයි. වැවේ ජලය මත කණු සිටවා කැවුම් මුට්ටි ඒ මත තබයි. මේ පූජා ප්‍රතික්ෂේප කර විකල්ප පුද සත්කාරයක් මෙහිදී පෙන්නුම් කරයි. දිය කැපීමේ දේව මංගල්‍යයෙන් කටයුතු නිම වේ.

ඉරුගල් බංඩාර මංගල්‍යය

පරපුරේ පීතෘ ඉරුගල් බංඩාර දෙවියන් උදෙසා පවත්වනු ලබන දේව මංගල්‍යකි. නිවෙස් පිරිසිදු කර පේවීමෙන් දේව මෙහෙය ආරම්භ වේ
සියළු දෙනාම එකම නිවසකට රැස් වී දේව යහන් සාදා දේව පූජාව ඔප්පු කරති. තම ගව පට්ටි වලින් ලබා ගන්නා කිරි වලින් සාදා ගත් ගිතෙල් මේ පූජාව සඳහා වෙන්කර ගනී.

කෝල්මුර ගැයුම් සහ පංචතූර්ය පූජාවද පැවැත්වේ. කැවුම් කිරිබත් කෙසෙල් බත් මුංඇට අමුනුකොල වට්ටක්කා ආදී ආහාර ජනතාවට පිරිනමා දෙවියනට පිං පමුනුවනු ලැබේ. පෙරැහැර පවත්වා දේව ආභරණ වීදි වැඩම කොට දිය කැපීමේ දේව මංගල්ල්‍යය අවසන් වේ.

විෂ්ණු දේව මංගල්‍යය

බැතිමතුන් පේවීමෙන් මංගල්‍යය ආරම්භ වේ. මෙහිදී ධාන්‍ය වර්ග යොදා කිරිබත් පිසා කැවිලි වර්ග හා කෙසෙල් ජනතාවට බෙදා දෙමින් දෙවියන්ට පින් පමුණුවනු ලැබේ. පංචතූර්යය නාදය සහිතව දේවාභරණ වීදියේ වැඩම කරවා දිය කැපීමෙන් දේව මංගල්‍යයඅවසන් වේ.

03 යක්ෂ ගෝත්‍රික නීති ක්‍රමය

මහානාම රජ සමයේ පැමිණි උර්දූලන් නීල වේලදු නම් ද්‍රවිඩ සෙනපතියා කළා වූ විනාශයෙන් මානැව කඳු අභියස පැවැති යක්ෂ ගෝත්‍රික පාලන කේන්ද්‍රය හා ජනපදය විනාශ වී ගියේය. එතෙක් ප්‍රවේණිගතව ආ යක්ෂ ගෝත්‍රික වෙද ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ, ත්‍රිපිටික සූත්‍ර ඇතුලත් ධරර්ම ග්‍රන්ථ නීති රීති ඇතුලත් ග්‍රන්ථ, සහ ගෝත්‍රික ග්‍රන්ථ රාශියක් විනාශ වී ගියෙන් අනාථ භාවයට පත් යක්ෂ ගෝත්‍රිකයන් එකරාශි කොට ඔවුනට නායකත්වය දීමට රත්නපාලි භීසව සමත් වූවාය. වංශික හිරතෙම් භාවයෙන්

ISBN 978-1-78280-808-4

සුදු හෙල්ල රන ඉරත්වලින් අඟ සැපත් රත්නපාලි බිසව උරදුණෝත් කීල වෙළඳ හා ද්වන්ද සටනකට එළඹ මහු මරා ඇමුංචි හොඳුරගේ ධීරත්වය හා වීරත්වය ප්‍රදර්ශනය කිරීමෙනි තම වරිගයාගේ යහපත උදෙසා වංශය සතු පොත් පත් ද ඥාති සමූහයාද රැගෙන මහිණුගල වැදී රජුගේ රැකවරණය පතා සත්තාතා ගිර ආගන්ත (සබරගම) සබර ගිරට පලා ගියාය වරිග නීති රීති සංග්‍රහයේ සඳහන්වන අන්දමට හොඳුරය නායකයා හෝ නායිකාව වංශය සතු වරිග සම්පත්වල අනන්‍යතාවය ආරක්ෂා කළ යුතුය. වරිග සම්පත් ලෙස මෙම් සඳහන් වන්නේ.

රජපුරව අධිපති - ගෞතම බුදුන්
රජපුරව පීතෘ - ඉරුගල් බණ්ඩාර
රජපුරව මව - කවිලාශ පාලි මුත්ත ලතා බිසව
රජපුරව පුරාවස්තු - බුදු රජුන්ගේ තඹ ධාතුව
රජපුරව චෛත්‍යය - විශකුම්භණ චෛත්‍යය
රජපුරේ ධජය - තඹ වෙහෙරෙහි ආකෘතිය
රජපුරේ පුෂ්පය - ශ්වේත පියුම
රජපුරේ පක්ෂියා - මයුරා
රජපුරේ සත්වයා - හස්තියා
රජපුරේ වෘක්ෂය - රුක් අත්තන
රජපුරේ ආයුධය - අසිපත
රජපුරේ මාණික්‍යය - ඉන්ද්‍රනීල
රජපුරේ ජය ලකුණ - හක් ගෙඩිය
රජපුරේ මෙහෙසිය -යශෝධරා (ප්‍රතිමූර්තාවට උපහාර වශයෙනි)
විහාර පාරයවය - මහා විහාරය
දේවතාවෝ මිත්තෝ - කිරිවෙහෙර දෙවියෝ ආදිමුතුන්

සතුරු ආක්‍රමණ සහ දුෂ්කරතාවයන් මැඩගෙන රත්නපාලි බිසව තම වරිගය සතු සම්පත් සුරැකීමට කටයුතු කළාය. ධාතුසේන රජතුමා විසින් විවිධ පරිත්‍යාගයෙන් වරිගයා වෙනුවෙන් ඇය කළ මෙහෙයට උපහාර වශයෙන් පුදන ලද නීලගිරි බිසව්වන නම් සන්නස් පත්‍රයේ වැකියකින් මෙසේ දක්වා ඇත

විලිගෙන
බිගෙන
ඉහුදෙන
තෙදෙන
මෙරරක මෙරරක මඩල
උළුවළු ඇසැන් ලියමෑ
උතුන් ඉරුගල් රන් වරිග ලියමෑ

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

ISBN 978-1-78280-808-4

ශ්‍රී රාවණාවී [illegible] [illegible] දෙවි [illegible] [illegible] දෙන, [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] සොහොයුරු වූ [illegible] [illegible] [illegible] [illegible].

එවින් [illegible] අප සොහුරු විභීෂණ ද්‍රෝහය, වැද, [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible] [illegible].

තබා ධම්ම ආරහත් විසන
නුඹ විත්තා මගේ සහෝද ඉපදුරසය
මා විත්තා නුඹ සහෝද රැකීය
නොසන් මා වියරම් නුඹ විසන්නම්
සහෝද ඉපදුරම ආරහතම්
මැ කරනුයන් අභිවෘද්ධි වීමන් පෙර නොකළීමා
සිතා කරන මේ විපතු ද කනුගාට කරන නොවන්
එහිදී මා ඉඩි පිළිගය ඉ
නොසන් නොවිද පිරිම් ද්‍රරහනුන්
මා කරනුන් නොවිනුත් ය නොකරන් ය
ඉන්පසුව පිළිගය.

තබා ධම්ම ආරහත විසන
නුඹ විත්තා මගේ රජ මිහි අප ලංක සහෝදරයන්
මා හිඩ විසන්සේ ගා රජ අප ලංක සොහුරන්
රජේ සෙයින් මගේ ප්‍රධානීන් ඉඩ විනාශනීය
මගේ සොහුරු විභීෂණ
මට දොස නොකියා සොඳට
සිතන්නෙත් කරන්නෙත් අපහ සොලූ සිතන්ම
එම් පැවැත්වීම රජ මගේ විනෝදය
රාජ්‍ය නොලොභත් මිතු දුරනට [illegible] [illegible] [illegible] [illegible]
තිබෙයය.

වරිග ජීවිත ක්‍රියාත්මක කිරීමේදී ඇයාමි විට වරමනට [illegible] [illegible] [illegible] [illegible] අප රංගයින් හමන මේ ලදුසට පෙවිනු [illegible] සොහුරු විභීෂණ [illegible] ආයාවනාත්මකව මැද වැටුන එම්වනී නව ප්‍රවිශ කරනු [illegible] කරන අප

යයහයින ප්‍රවමාංවො (වැරදිකරුවෝ)
බුදුන් කරා අඩංගු මිඩංගු නොකියන
දෙවි කරා අඩංගු මිඩංගු නොකියන
උතු මා පිය කරා අඩංගු මිඩංගු නොකියන
රජුට අඩංගු මිඩංගු නොකියන
වරිගයට අඩංගු මිඩංගු නොකියන
උතු ලොව උතු කරනයෙට මිය ආයෙම ප්‍රථණ කරනෙ.
(මිතු ද්‍රෝහය කිරීමට බිරෙනව බැර දීම ඉලූව)

රාවණ වංශය පුස්තක සංරක්ෂණාගාරය සතුය

ISBN 978-1-78280-808-4

එම ප්‍රකාශයට අනුව ගෝත්‍ර නීති බෞද්ධ ආගමය තුළින් සංයෝග කර ව **ගිවිසුම** ඇතිකර ගැනීමට රත්නපාලි රැජින සොයුර හිමියන්ට ප්‍රතිඥා දුන්නාය. රත්නාපාලි බිසව ඉදිරිපත් කළ වරදකරුවන්ට මරණ දඬුවම නියම කළ යු නීතිය චාංගික ප්‍රභූ මණ්ඩලය අනුමත කලද තබාධම්ම හිමියෝ ප්‍රකා සාහසිකයකුට වුව ද තෙවරක් අභය දානය පිරිනමා පුනරුත්ථාපනය කළ යු එසේ නොවුනහොත් සිරි රත්නාවලිය රැජිනියගේ වර්ග ධර්ම ගිවිසුම මගින් නොගත් තැනැත්තන් කෙරෙහි නීතිය අනුව ක්‍රියා කිරීමට අවධානය යොමු කර පැවසුහ. රකුන් ආඥා වලින නීති පුස්තකයට අයත් සඳුන් බැඳි පුස්තක කරුණු ඇතුලත්ය. මරණීය දඬුවම සඳහා නීතිය මගින් අනුමත ක්‍රම 4 කි.

කුසන මාරකය

වැරදි කරුගේ සිරුර කපා ඉරා දුක්ඛිතභාවයට පත් කර මරා දැමී සඳහා කිර කුසනය නම් උපකරණය භාවිතයට යොදා ගැනේ. තියුණු මුවගත් ඇති පීප්පයක් බඳු දෙයකට ඇතුල් කර එයට අට දෙනෙකු විසින් කර කැවි මෙය කැරකැවීමේදී වරදකරු කැපී ඉරී මරණයට පත් වේ.

කළිඟු මාරකය

ගෙල සිඳ මරා දැමීමයි. වැරදිකරුගේ ගෙල රත්මල් බැඳ මිටියෙන තලා එදකබෙර වයමින් වීදි ජනපදය සංචාරය කරවයි. එසේ කරනුයේ ජනතාවට නීතියේ බලය පෙනවීමටයි.

කාඩිය ගසේ කඳත් කපා සාදා ගනු ලබන දනගෙඩියක හිස තබා කඩු ගෙල සිඳීම කරනු ලැබේ.

සෙපිලි මාරකය

මේ දඬුවම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී විෂ සහිත කුහුඹුවන් හා යොදා ගැනේ. *දළපයෝ (දළකඩ) බොටයෝ, කොරාවෝ* යන විෂ සහිත කුහුඹු ව දඬුවම් ක්‍රමයට යොදා ගනී. මෙහිදී වරදකරුට කුහුඹුවන් සිටින ස්ථානයක සිටින්නට නියෝග කරයි. ඉන්පසු විෂ පෙවූ හෙල්ලෙන් ඇණ මරා දැමීමේ ක්‍රමය මාරකයයි.

තෙලාබු මාරකය

අධික ගින්නෙහි පස්සන ලද තෙල් කටාරමකට දමා මරණයට ප කිරීම තෙලාබු මාරකයයි. ඒ සඳහා තෙල් වර්ග හතරක් නියම කොට ඇත.

කෑට තෙල
කඳුරු තෙල
තිඹොටු තෙල
අම්බාට තෙල

ISBN 978-1-78280-808-4

රකුන් අණලෑවලිය

මේ තෙල් කවර වර්ගයන් තෙල්ද නිශ්චිතව කිව නොහැක. තෙල් වලට අමතරව කබරගොයාගේ මල පහ ද යොදා ගැනේ. තෙලාබු මාරකය අත් කිරීම සඳහා පහත නීති විරෝධී ක්‍රියාවලින් එකක් සිදු කර තිබීම ප්‍රමාණවත්ය.

1. *භික්ෂු භික්ෂුනීන් ඝාතනය කිරීම*
2. *භික්ෂු භික්ෂුනීන්ට ප්‍රසිද්ධියේ අපහාස කිරීම*
3. *පූජා වස්තු විනාශ කිරීම*
4. *මව්පියන් මැරීම*
5. *ස්ත්‍රී දූෂණය*

තෙලාබු මරණීය දණ්ඩනය එකල ප්‍රසිද්ධ දඬුවම් ක්‍රමයකි. මේ මරනීය දඬුවම් ක්‍රමය යක්ෂ ගෝත්‍රිකයන්ට සුදුසු නොවන බැවින් බොහෝකොට පුනරුත්ථාපනය කිරීම සුදුසු ක්‍රියාවක් සේ පිලිගත්හ. පැරණි රාජ වංශයට අයත් මේ ගෝත්‍රයන්ට සතුරු කරදර හේතුවෙන් නොයෙක් අතවරයන්ට මුහුණ දීමට සිදුවිය. එනිසා රත්නපාලි බිසව මේ අභිත වාක්‍ය ප්‍රකාශ කළාය. *,හස්තියෙකු දැත දෙපා කම්මෝතු වී දීගා වී මුත් කොරොස් තාගුවේ දිය ස්නානය කරවනු නොහැක්කා සේ අටලෝ දම් මිටිටේ මුසපේතුව නියාවෙන් නීලගිරි වරිග වන්නි ඉරුගල් බංඩාර රක් වරිගයේ තෙද බිදුලූ නොහැක්කෙමයැ. ,*

හස්තියෙකු දැත දෙපා අහිමිවී වැතිර සිටියද කොරහක දිය නාවනු නොහැකි සේ අටලෝ දහමේ නියමයන්ගෙන් වන්නි ඉරුගල් බන්ඩාර වංශයේ තෙද බිදලිය නොහැකි බව මෙයින් කියැවෙයි.

යක්ෂ ගෝත්‍රිකයන්ගේ නීති ඇතුලත ග්‍රන්ථ වන්නේ *රකුන් අණඬොවලිය නීති පුස්තකයයි.* එම පුස්තයේ පත්ඉරු සංඛ්‍යාව වරිගපුර්ණිකා කතුවරයා සඳහන් කරන්නේ *කුදුසොව්ව* යනුවෙනි. එහි ගණන 1400 ක් පමණ විය හැකිය. රකුන් අණඬොවලිය කොටස් තුනකින් යුක්තය.

1. *හස්ති මදාරා බැදී අණපත*
2. *රුක් අත්තන බැදී අණපත*
3. *සඳුන් ලී බැදී අණපත*

හස්ති මදාරා වෘක්ෂයේ ලියෙන භාහිර ආවරණය යොදා තිබුණ පුස්තකය හස්ති මදාරා බැදී අණපත නමින් හැදින්වේ. රුක් අත්තන සඳුන් ලී වලින් සාදා ඇති පුස්තක වලට පොත් කවරය සාදා ඇති ලී වර්ගයට අනුව එම නම් යොදා ඇත. වරිගපුර්ණිකාව මේ සඳහා නව අර්ථකථනයක් දෙයි. යොදා ඇති ඇව වර්ගය අනුව *සිලවතුන්, බහුශ්‍රැතයන්, කාන්තාවන්,* සංකේතවත් කෙරේ.

හස්ති මදාරා බැදී අණපත ග්‍රන්ථ 06 කට බෙදා වෙන්කර ඇත. බුද්ධමුල, දේවමුල, *වරිග මුල, මහිලාමුල, විපුටමුල, දායිත කණ්ඩිපමුල, බද්ධමුල,* ග්‍රන්ථයේ අන්තර්ගතව ඇත්තේ බුද්ධ ශාසනය සුරක්ෂිත කිරීම් උදෙසා පිලිපැදිය යුතු නීති මාලාවයි. දේව වන්දනය පදනම් කරගෙන සැකසුන නීති මාලාව දේවමුල ග්‍රන්ථයට ඇතුලත්ව ඇත. වංශයේ ආර්ථික පරිපාලනය හා විවිධ සිප්සතර සඳහා පැනවූ නීති රැගත් ග්‍රන්ථය

ISBN 978-1-78280-808-4

වරිග මූලයයි. කාන්තා විනය හා වරප්‍රසාද සඳහා සකස් කළ නීති මාලාව මහිලා මූලයට අයත්ය. වංශික සම්ප්‍රදායන් සුරැකීම උදෙසා පැනවූ නීති විපුව මූල ග්‍රන්ථයට ඇතුලත්ය. දැසි දස් කම්කරු සතුරන් ආදීන් ගොඩනැගූ නීති, දණ්ඩ නීති, ද්‍රාසික, කණ්ඩප මූල ග්‍රන්ථයට ඇතුලත්ය.

රැක්අත්තන බැදි පුස්තකය නීතියේ දෙවන පරිනතයයි. එය ඉරුගල් තෙදෙය, මුහුන් දෙයුර, සිලිම්යාපත, නිලගිරි සත්තය යන ග්‍රන්ථ ඇසුරු කරගෙන සකසා ඇත. මෙහි වංශික අධිකරණය කොටස් දෙකකින් යුක්ත විය යුතු බව අවධාරනය කරයි. එනම්,

1. රාජ සභා අධිකරණය
2. වරිග සභා අධිකරණය

යනුවෙන් ද්වි විමර්ශන විනිශ්චමඩුල්ලක් වෙත නීතිමය බලය පවරා ඇත. යම් අයෙකු වෙතින් සිදු වන බරපතල ගණයේ නීති විරෝධී ක්‍රියාවක් විනිශ්චය කිරීම රාජ සභාව මගින් සිදුවන අතර සුලු නීති විරෝධී ක්‍රියාවක් විනිශ්චය කිරීමේ බලය වරිගසභා සම්මුතියට පැවරේ. රැක්අත්තන බැදි පුස්තකයේ සඳහන් වන අයුරින් වරුදෙහි ස්වභාවය, චෝදිතයා පිළබඳ විස්තර සිදුකළ වරද කෙරෙහි පූර්ණ විමර්ශනය, දඩුවම් තීන්දු කිරීම, සමාව ලබාදීම යනාදි කරුණු පිළිබඳව සියලු අධිකරණ ප්‍රධානීන් හා නිලධාරී මඩුල්ලෙහි බහුවාරික සාකච්ඡාවකින් පොදු නිගමනයකට පත් විය යුතුව ඇත. නඩු විනිශ්චය කිරීමේදී හෝරා, දින, සති, මාස වසර වශයෙන් නඩුවේ ස්වභාවය අනුව තීරණය කළ යුතුය. ප්‍රජා දේපල විනාශ කිරීම, තෙත් බිම් විනාශ කිරීම, මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, සෙරකම් ආදී බරපතල ගණයේ අපරාධ සිදුවූ මොහොතේම නිලධාරීන් හරහා අධිකරණයට දැනුම් දිය යුතුය. නීති විරෝධී ක්‍රියාවක් කළ පුද්ගලයෙකු ගැන පැමිණිලි කිරීමේදී සම්මත ක්‍රමයට අනුව ප්‍රථමයෙන් එය වරිග මණ්ඩලයට දැනුම් දිය යුතුය. ඉන්පසු එම නිලධාරීන් වෙතින් මහිලා මණ්ඩල නිලධාරිනීන්ටද ඔවුන් වෙතින් කෙදෙව් රකුනා නිලධාරියා වෙතද යනාදී වශයෙන් පැමිනිලි කිරීමේ නිල කාර්යය විධිමත්ව සිදු කරනු ලැබේ. කොදෙව් රකුනා නිලධාරියා අධිකරණයට, ලේඛනය ඇතුලත් කිරීමෙන් පසුව සභා විනිශ්චයට පමුනුවයි. සභාවේ රැස් කිරීමේ දිනය වරිගසභා නිලධාරීන්ගේ සම්මුඛ සාකාච්ඡාවකදී තීරණය කරනු ලැබේ. සුළු වැරදි, බරපතල වැරදි වශයෙන් හඳුනාගෙන වරිග සභාවේ විනිශ්චය කොට විශේෂ නිර්දේශයක් ඇතිව ද්විතීය විමර්ශන සඳහා රාජ සභාවට යොමු කරනු ලැබේ.

සඳුන් බැදි පුස්තකය

රකුන් අණඟාවලි නීති ග්‍රන්ථයෙහි සමාප්ත කෘතිය ලෙස සලකන සඳුන් බැදි පුස්තකයෙන් වංශික දණ්ඩ නීති සංග්‍රහය පිලිබඳ පුළුල් විග්‍රහයක් කෙරේ. දඩුවම් පැමිනවීමේදී ධනය, බලය, නිලය ගැන සැලකිලිමත් නොවී තීන්දුව ක්‍රියාත්මක කළ යුතු බව පලමු පරිච්ඡේදයෙන් ප්‍රකාශ කරයි. මෙය විශේෂත්වයෙන් සැලකිය යුත්තක් බව පෙන්වීමට පුස්තකයේ ඒ කියමන විශාල ප්‍රමානයේ අක්ෂර වලින් සටහන් කොට ඇත. දූෂාබාධ සඳහා යොදාගත් උපායකි එය. මෙය උපග්‍රන්ථ, 4 ට බෙදා දැක්විය හැක.

1. මෙත්තානු මූල
2. තේජානු මූල

ISBN 978-1-78280-808-4

3. ගර්ජානු මූල
4. රීරි මූල

පූර්ව මධ්‍යම තත්කාලීන නීති රීති ග්‍රන්ථාරූඪ කර තිබීම මෙහි ඇති විශේෂයයි. නීති සකස් කිරීමේදී බුදු දහමේ ආභාසය ලබාගෙන තිබේ.

මෙත්තානුමූල දඬුවම් න්‍යාය

අවිහිංසාවාදී ප්‍රතිපත්තීන් ප්‍රගුණ කිරීම මෙම න්‍යාය තුළින් අරමුණු කෙරේ. සමාව දීම, අභය ධානය දීම, මේ ප්‍රතිපත්තීන්ට අන්තර්ගතය. මෙත්තානුවරය ලබා ගැනීමට සුදුස්සක් ගේ සලකනු ලබන්නේ පහත සඳහන් කරුණු අනාවරණය වුවහොත් පමනි.

1. වැරදි කරු නීති විරෝධී ක්‍රියා කොපමණ කර තිබේදැයි විමසා බැලීම සිව් වරක් නීති විරෝධී ක්‍රියා කර ඇත්නම් ඔහුට හෝ ඇයට මේ මෙත්තානුවරය අහිමි වේ
2. වැරදිකරු වරදෙහි බැඳීමට මූලික වූ හේතුව පිළිබඳ සොයා බැලීම.
3. වරද කිරීම සිදුවූයේ ස්වයං තීරණ මතද අන්‍යයන්ගේ බලකිරීම් මතද යනුවෙන විමසා බැලීම.
4. හානි වූ දේපල හෝ මානව හිමිකම් පිළිබඳව විමසා බැලීම
5. වැරදිකරු මානසික රෝගියෙක්ද යන්න විමසා බැලීම

මේ කරුණු තහවුරු කර ගැනීමට අපරාධ විමර්ශන ක්‍රම වෙද පරීක්ෂණ ක්‍රම. ආදිය උපයෝගි කරගනු ලැබේ. මෙම න්‍යාය වරයෙන සමාව ලද තැනැත්තන් සඳහා අතුරු නියෝග පනවනු ලැබේ. *අරණ ක්‍රියා, දේව ක්‍රියා* වශයෙන් එය හඳුන්වයි. අරණ ක්‍රියා ලෙස සලකනුයේ වැරදි කරුවන් පුනරුත්ථාපන කඳවුරුගත කිරීමයි. ඒ සඳහා *ධර්මධර විනයධර හා කමටහන්ධාරී* භික්ෂුන් වහන්සේලාගේ මූලිකත්වයෙන්ද අධීක්ෂණයෙන්ද යුතු මණ්ඩලයක් ක්‍රියාත්මක විය. එහිදී පුනරුත්ථාපනය වන අය උදෙසා *අරණ ශුද්ධිනයෝ* යන නාමය භාවිතා කරයි.

ද්විතීය අවස්ථාව වන්නේ වංශයේ දේව පූජා විධි සඳහා ත්‍රිවිධවර මෙහෙය සිදුකරන මෙන් නීති ආඥා පැනවීමයි. ඉරුගල් බණ්ඩාර වංශිකයන් දැඩි සංවේදීතාවයෙන් යුතුව දේව වන්දනාව සිදු කරනු ලබයි. සූත්‍ර පිටකයේ එන මහා සමය සූත්‍රය වරිග පිරිත් සන්නස් දේව ආභරණය ලෙසින් පූජාවස්තුවක් බවට පත්කර ඇත්තේ එසේ හෙයිනි. මෙත්තානුවරය මගින් වැරදිකරුවන් සඳහා ත්‍රිවිධවර දේව මෙහෙය කිරීමේ ආඥාව පනවයි. ත්‍රිවිධවරය ලෙස හඳුන්වා ඇත්තේ දෙවියන් සඳහා *බුද්ධිමය මෙහෙය ශ්‍රමික මෙහෙය, පඬුරු මෙහෙය* ආදියෙන් කැප කිරීමයි. දෙවියන්ගේ නාමයෙන් ගද පද රචනා කිරීම බුද්ධිමය මෙහෙවරට අයිතිය. පූජා භූමි හා පූජා කටයුතු සඳහා ශ්‍රමය යෙදවීම ශ්‍රම මෙහෙවරයි. දෙවියන් උදෙසා පුදන මුදල්, ගම්වර, පූජා, රං රිදී මුතු මැණික් ධානය, ගව මහිෂාදීන් පඬුරු පූජාවක් ලෙස හඳුන්වයි. අධිකරණය මගින් ත්‍රිවිධවර මෙහෙය සිදුකර ලීමට ආඥාව පැනවීමෙන් පසු වරදකරු හෝ වරදකාරිය විසින් එම අණ ඉටුකළ යුතුය. නීතිමය ආඥා ඉටු කරන චෝදිතයන් සම්මත වූ කාල නියමයකින් පසු නිදහස ලබයි. බිහිසුනු අපරාධ වලට සම්බන්ධ යැයි චෝදනා ලබන පුද්ගලයින් මෙත්තානුවරය ලැබීමෙන් පසුව ඇහැම් දිවියකට යොමු වූ

ISBN 978-1-78280-808-4

වම රඳන් [illegible] ප්‍රකාශ වූ බව [illegible] සඳහන් වෙයි. යමගිරිය තම මිනිස් ඝාතන අපරාධකරුගේ චරිත කථාව උදාහරණයක් ලෙස [illegible] හැක. යමගිරිය [illegible] මව්ගේ අනාදරය නිසා බාලවියේ සිටම මානසික පීඩා විඳින්දෙය එම ප්‍රතිඵලයක් ලෙස [illegible] වැද මිනිස් ඝාතකයෙක් විය. ඔහු දරුණු සොරෙකු වූවද [illegible] වලට හා පොදු දේපළ වලට හානි පැමිණවූයේ නැත. [illegible] සහ රාජ[illegible] [illegible] ප්‍රකාශයට පත් කළේ එයේ හෙයිනි. යමගිරිය මාස 6 [illegible] [illegible] [illegible] ලැබීය. [illegible] ඔහු [illegible] [illegible] මානසික [illegible] ඇති කරන්නක් බව [illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

රාවණ වංශ පුස්තකාල සංරක්ෂණාගාරය

ISBN 978-1-78280-808-4

3. [illegible]

4 [illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

1 [illegible]

2 [illegible]

ISBN 978-1-78280-808-4

3 රකුන පගුරුවන අධිකය ගෝත්‍රය වී මෑ
4 රකුන ලිංලේ අධිකය ගෝත්‍රය වී මෑ

මේ අනුව එඩි අධිකය (එඩිතර බව) සාමග්‍රී අධියස (සාමය) පගුරුවන අධි (සමගිය) ලිංලේ අධිකය (අවංකබව) යන සතර යකම ගෝත්‍රිකයන්ගේ නීතින් පදනමයි. යකම ගෝත්‍රිකයින්ගේ නීති අනුව මුලින්ම හමුවන්නේ බුදු සසුන ආරක්‍ෂා පිළිබඳ නීතියයි. .තෙදීන බල දාරකයනි. සසුන රක්ෂිතවන්නා සේ තොප රක්ෂිතයෝ වන. (දරුවනි. සසුන ආරක්‍ෂා වූ විට තොපද ආරක්‍ෂා වුවා සේ යන නියමනව සකස් වී ඇති නීති රීති වරිගපූර්ණිකාවේ සඳහන් වන්නේ මෙසේය)

1 උවැට තිල සද්ධන්ගිරය තෙරපීලුය (සිවුපසයෙන් සංග්‍රහ කළ යුතුය)
2 සෝසිලමිබු සද්ධන්ගිරය තෙරපීලුය (පිරිවෙන් ශාලා සාදවා පූජා කළයුතුය)
3 කයිවාර සද්ධන්ගිරය තෙරපීලුය (පොකුණු උද්‍යාන ගිලන්හල විහාරගෙය පූ කළයුතුය)
4 උහැන බෝධි මුල මුරය තෙරපීලුය (භාවනා ආරණ්‍ය පූජා කළ යුතුය)
5 හිකමු භිකමුණින් හිරමලූහයන තෙරරපීලුය (හිකමු හිකමුණීන්ට ශාරීරික පීඩා නොකළ යුතුයි)
6 හිකමු හිකමුණින ජයපාලූහය තෙරපීම (හිකමු හිකමුණීන්ට අපහාස නොකළ යුතුය)
7 ශාසන සවිධි මුණය තෙරපීම (සංඝ භේදය නොකළ යුතුය)
8 හිකමු වට්ටල ගිරම මුරබිය කළ පීම (පැවිදි උවිය අතහැර යන අයට අපහා නොකළ යුතුය)

මෙයට අමතරව පහත කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන නීති රැසක් ද සඳහන කරයි

1 සසුන් ද්‍රෝහීන් මර්ධනය කිරීම.
2 ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කිරීම සහ ධර්ම සංගායනා කිරීම
3 පූජා වතාවත් අඛණ්ඩව සිදුකිරීම.
4 අභය දාන සීමාමාලක කර වීම (සතුන් සඳහා)
5 ශාසන වස්තූන් ආරක්‍ෂා කිරීම

කාන්තාවන්ගේ වරප්‍රසාද ආරක්‍ෂා කිරීමෙහි ලා පිරිමිනට නීති සකස් කර ඇති අයුරු.

මෝකුර පුරුෂ වාහක මැඩි පා යුකතො මැ වන (සියලු පුරුෂයන විසින අනුගමනය කළ යුතුය

1 තෙපිනාස කවිලාශපාලි බොමුධිර කුදය වඩාලු මැවන (සියලු පිරිමින වරිග සම්ප්‍රදායට අනුව නෙම්කම්ම පාරමී ගුණය පූර්ණ වශයෙන හෝ අර්ධ වශයෙන හෝ ආරක්‍ෂා කළ යුතුය මෙය බෝ මුදීර ප්‍රතිපත්තියයි)
2 තෙපිනාස කවිලාශපාලි කුපිතල කුදය වඩාලු මැවන (ස්ත්‍රී දූෂණය නොකිරීම හා අනුවල නොදීම පරපුරේ හා අන්‍ය ජාතික සියළු ස්ත්‍රීන්ගේ ගෞරවය ආරක්‍ෂා කිරීම

ISBN 978-1-78280-808-4

ස්ත්‍රීන් වරදෙහි හැසිරීම නොකළ යුතුය. ස්ත්‍රීන් [illegible] [illegible] [illegible] නොකළ යුතුය. මෙම කව්ලාපොලි [illegible] [illegible] වූ [illegible] [illegible])

3 පොජිතාග කව්ලාපොලි [illegible] කුදය වඩිනු මැඩින ([illegible] ස්ත්‍රීන් සඳහා [illegible] සාධාරණ වරප්‍රසාද, [illegible] දීම, ස්ත්‍රීන්ගේ [illegible], [illegible] හා [illegible], [illegible] කොල්ලාර ප්‍රතිපත්තියකි)

4 පොජිතාග කව්ලාපොලි [illegible] කුදය වඩිනු මැඩින ([illegible] [illegible] [illegible] රැකීම කුමාර බ්‍රහ්මචාරීත්වය රැකීම [illegible] [illegible] [illegible] [illegible] හැරෙ වීම. [illegible] ප්‍රතිපත්තියකි)

5 පොජිතාග කව්ලාපොලි [illegible] කුදය වඩිනු මැඩින ([illegible] [illegible] [illegible] යුතුය. ගැබිනියන්ගේ [illegible] [illegible] [illegible] යුතුය [illegible] [illegible] [illegible] [illegible] නොගිය ස්ත්‍රීන් සඳහා [illegible] [illegible] නොකළ යුතුය [illegible] [illegible] [illegible] [illegible] ද ඇතුළත්ය)

6 පොජිතාග කව්ලාග පාලි [illegible] [illegible] කුදය වඩිනු මැඩින ([illegible] [illegible] ඇති කර ගත යුතුය)

7 පොජිලාත කව්ලාග පාලි උරුවෙල කුදය වඩිනු මැඩින ([illegible] [illegible] නොකළ යුතුය. ස්ත්‍රීන් වරදෙහි නොයෙදවිය යුතුය)

8 පොජිතාග කව්ලාපොලි උපසාග කුදය වඩිනු මැඩින ([illegible] [illegible] [illegible] [illegible] යුතුය. මත්ද්‍රව්‍යයෙන් වැලකිය යුතුය)

ස්ත්‍රීන් සඳහා පනවා ඇති රීති

ඉලුවමෝ සුරමහිලා කොතෙති මැඩිනා යුතු මැ වන ([illegible] [illegible] [illegible] [illegible] කළ යුතුය

1 තබ්බිනිකාග කව්ලාගපොලි ප්‍රහැත වර කුදය වඩිනු මැඩින ([illegible] [illegible] [illegible] [illegible] කර ගැනීම. සිව්පොදා බ්‍රහ්මචාරීව විසීම කුමර බ්‍රහ්මචාරිත්වය රැකීම [illegible] රැකීම, උත්‍රාවක්‍රසප්ත ශීලය රැකීම යනු [illegible] කුදයයි. [illegible] [illegible] [illegible] [illegible] ආමන්ත්‍රණයයි. මෙහි උත්‍රාවක්‍ර ශීලය [illegible] [illegible] [illegible] [illegible] [illegible] කාන්තාවන් ජීවිත කාලය තුළ එකම පිරිමියෙකුට [illegible] [illegible] [illegible] ප්‍රතිපත්තියයි)

2 තබ්බිනිකාග කව්ලාගපොලි විදුර කුදය වඩිනු මැඩින ([illegible] [illegible] [illegible] ජීවත්විය යුතුය. විනායානු වස්ත්‍ර සහ විනයාභරණ [illegible] යුතුය. [illegible] ආභරණ වර්ග 3 ක් යක්ෂ ගෝත්‍රික නීති මගින් අනුමත කර ඇත. [illegible] [illegible] [illegible] මුහු හරණ බසකි ආභරණ බසකි [illegible] බසකි [illegible] [illegible] [illegible] [illegible] බෙද ගැමි යනුවෙන වර්ගපුරණීකාවේ සඳහන් කරයි)

1 *හරණ* (ලය කොටසින උඩ කොටස සඳහා පළඳින ආභරණ [illegible] [illegible] [illegible] [illegible] ගෝත්‍රිකයන්ගෙ ලලාට ආභරණ, [illegible], [illegible], [illegible], පයෝදරාභරණ, [illegible] [illegible] මේ සඳහා [illegible] [illegible] [illegible] [illegible])

2 *ආභරණ* (වලලු, මුදු, තමර [illegible] [illegible] [illegible] පාද [illegible] [illegible] මෙම ආභරණ කොටසට අයත් වේ)

3 *[illegible]* (ගර්භාභරණ හා [illegible] මෙම වර්ගයෙහි [illegible] [illegible] [illegible] කතුන්ගෙ කුමරි [illegible] [illegible] [illegible] [illegible] 14 [illegible] [illegible] [illegible] යුතුය [illegible]

ISBN 978-1-78280-808-4

කතුන්ගේ පතිනි ගුණ බන්ධන පද්මාභරණය. පොට 7 කින් සමන්විත විය යුතුය මෙම ත්‍රිවිධ ආභරණ ද්‍රව්‍ය *පැටිල ද්‍රිතම් නායමිය* යනුවෙන් හඳුන්වා ඇත)

3. තච්චිත්තාශ කච්ලාශපාලි දුරට්ඨ කුදය වඩාලු මැවන (පුරුෂයින්ගේ රාගාශ උද්දීපනය වන හැසිරීම් ක්‍රියා ආදිය නොකළ යුතුය)
4. තච්චිත්තාශ කච්ලාශපාලි ජාතිනිස කුදය වඩාලු මැවන (ගණිකා වෘත්තිය කිරීම හා කරවීමෙන් වැලකීම)
5. තච්චිත්තාශ කච්ලාශපාලි මාතෘවර කුදය වඩාලු මැවන (ගබ්සා කිරීම, දරුවන් මැරීම, අසම්මත අයුරින් දරුවන් බිහි කිරීම ආදියෙන වැලකීම එවැනි වැරදි වලට අනුබල නොදීම)
6. තච්චිත්තාශ කච්ලාශපාලි මනොල කුදය වඩාලු මැවන (මත්ද්‍රව්‍ය වලින් වැලකීම හා එවැනි වැරදි වලට අනුබල නොදීම)
7. තච්චිත්තාශ කච්ලාශපාලි පුදුලන කුදය වඩාලු මැවන (විකෘති කාමයෙන් බැහැර වීම)
8. තච්චිත්තාශ කච්ලාශපාලි උපසාය කුදය වඩාලු මැවන (සර්ව කුසලතා ප්‍රගුන කිරීම බුද්ධියෙන් හා එඩිතර භාවයෙන පුරුෂයන්ට සම සමව සිටීම. ගෘහ සම්පත් ආරක්ෂා කිරීම. පොදු සම්පත් රැකීම)

සියලුම වංශිකයන් සඳහා අනුමත වු නීති රීති පිළිබඳ ප්‍රකාශය

පොදුවේ සියළුදෙනාට පනවා ඇති නීති රීති ප්‍රධාන කොටස් 8 ට බෙදා දක්වා ඇත.

1. රකුන වරිග පනදල සොලියැ මැ (මේ කොටසට අයිති වන්නෙ ගෘහ ජීවිතය සඳහා තකස් වු නීති වගන්ති 300 කි)

නොගැලපෙන ගෝත්‍රයන් හා විවාහයන් නොකළ යුතුය. උත්‍රාවක්‍රමාලාභරණ චතුර්ධනාභරණ, බ්‍රහ්මචාරී යහන, අනඟ යහන, යසස්ථ මංගල පෝරුව, ධවල ජන්දන පිරිත් පැන් අතලය ආදී විවාහ චාරිත්‍ර අනුගමනය කළ යුතුය.

2. රකුනු වරිග දශාක සොලියැමැ (සතුරන ජය ගැනීම සටන් ක්‍රම පිළිබඳ නීති මෙයට ඇතුලත්ය)
3. රකුනු වරිග දුනසර සොලියැමැ (මෙහෙකාර සේවය ලැබීම පිළිබඳ නීති මෙයට ඇතුලත්ය. යක්ෂ ගෝත්‍රිකයන් මෙහෙකාර සේවා ලබාගත යුතු කුල 10 ක් පිළිබඳව මෙමගින් දක්වා ඇත)

තුරු වැදග - (හෙවිසි තූර්යවාදකයන්ගේ සේවාව)
උතුරු වැදග - (ශුද්දකාරයන්ගේ සේවාව)
උණ්ඩර වැදග - (කම්හල් කරුවන්ගේ සේවාව)
පණ්ඩර වැදග - (දෝලාකරුවන්ගේ සේවාව)
ජණ්ඩර වැදග - (මඟුල් කපුවන්ගේ සේවාව)
ශූවිධ මුර වැදග - (දූතකම් කරුවන්ගේ සේවාව)
ඩණ්ඩර වැදග - (කරණවෑමියන්ගේ සේවාව)
ඉරුකාල වැදග - (කුඹුලුන්ගේ සේවාව)

ISBN 978-1-78280-808-4

ඉරුගල් බණ්ඩාර පරපුරේ අධිපති ගෞතම බුදුන් ලෙස

මාතෘ වැඳුම - (ආතරංග කරුවන්ගේ ගේමාව)
මුණ්ඩාල වැඳුම - (සකල යෝධයන්ගේ ගේමාව)

4. රකුන වරිග පිංදනක සොලියැ මැ. (ආහාර පිළිබඳ නීති)
